**මාර්ග සංවර්ධන අධිකාරිය - 2022**

---------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මාර්ග සංවර්ධන අධිකාරියේ (“අධිකාරිය”) 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.
මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) (i) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 02 හි 25 ඡේදය අනුව, කායීමණ්ඩලය සඳහා ලබා දෙන ලද ණය ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දැක්විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ කායීමණ්ඩලය සඳහා ලබා දෙන ලද හා අයකර ගන්නා ලද ණය මුදල්වල ශුද්ධ ප්‍රතිඵලය වූ රු. මිලියන 13.06 ක් කාරක ප්‍රග්ධන වෙනස්වීම් යටතේ දක්වා තිබුණි. | අධිකාරියේ සේවක ණය ලබාදීම් / අය කරගැනීම් ආයතනයේ අනාගත සේවා ඉටුකිරීමට අවශ්‍ය සම්පත් සඳහා ආයෝජනය කිරීමක් නොවේ. එය ආයෝජනයන්ගෙන් බැහැරව මෙහෙයුම් චක්‍රය තුල සිදුකරන ලද්දක් බැවින් මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ පෙන්වා ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02 ට අනුකූල විය යුතුය |
| (ආ) | අධිකාරියට අයත් පිරිවැය රු.මිලියන 503.5 ක් වූ වාහන 134 ක්, පිරිවැය රු.මිලියන 50.4 ක් වූ ගොඩනැගිලි 94 ක් සහ පිරිවැය රු.මිලියන 111.5 ක් වූ ෆෙරි බෝට්ටු සහ කන්ටේනර් 2021 ජනවාරි 01 දින වන විට සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබුණි. එසේ වුවද, එම වත්කම් තවදුරටත් අධිකාරිය භාවිතා කරමින් පැවති නමුත් රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 අනුව එම වත්කම් පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය අනාවරණයන් කර නොතිබුණු අතර රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 අනුව එම වත්කම්වල ඵලදායී ජීවිත කාලය පිළිබඳව වූ ඇස්තමේන්තුගත දෝෂය නිවැරදි කර මූල්‍ය ප්‍රකාශනවල ගැළපීමට ද කටයුතු කර නොතිබුණි. | සම්පූර්ණයෙන්ම ක්ෂය වී ඇති වාහන සම්බන්ධව එහි තක්සේරු වටිනාකම් සඳහා අදාල ගැලපුම් කිරීමට අපේක්ෂිතය. සම්පූර්ණයෙන් ක්ෂය වීමට ලක්වී ඇති ගොඩනැගිලි ගණන 95 කි. දැනට මෙම ගොඩනැගිලි පන්තියම තක්සේරු දෙපාර්තමේන්තුව හරහා තක්සේරු කටයුතු සිදුකෙරෙමින් පවතී. | ප්‍රමිතය අනුව වාර්ෂිකව වත්කම්වල ප්‍රයෝජනවත් ජීවිත කාලය සමාලෝචනය කර ක්ෂය වෙන්කිරීම කළ යුතු බව. |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි ඡේද අංක 42 අනුව, වත්කමක් ලෙස හඳුනාගැනිමෙන් පසු දේපළ පිරියත උපකරණ අයිතමයක සාධාරණ අගය විශ්වාසදායී ලෙස | මෙම වාහන 271 සඳහා තක්සේරු වටිනාකම් ලබාගැනීමෙන් පසු අදාළ ගිණුම්කරණ ක්‍රියාවලිය සිදු කරනු ලැබේ. | ප්‍රමිතය පරිදි වාහනවල සාධාරණ අගය තක්සේරුකර ගිණුම්ගත කළයුතු |

| | | | |
|---|---|---|---|
| | මැනිය හැකි විටදී සාධාරණ අගයට ගිණුම්තැබිය යුතු වුවත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විට අධිකාරියේ භාවිතයේ පැවති මෝටර් වාහන 271 ක වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි. | | බව. |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 43 වන සහ 51 වන ඡේද අනුව, දේපළ අයිතමයන්ගේ සාධාරණ වටිනාකම සාමාන්‍යයෙන් වෙළඳපළ පදනම් සාක්ෂි මත ඇගයීමක් කළ යුතු අතර වත්කම් පන්තියම ප්‍රත්‍යාගණනය කළ යුතු වේ, ඒ සඳහා පිළිගත් හා අදාළ වෘත්තීය සුදුසුකම් ඇති තක්සේරුකරුවෙකු විසින් ප්‍රවර්ථන වෙළඳපළ මිල තක්සේරු කළ යුතු වුවත්, එසේ නොමැතිව, අධිකාරිය සතු වාහන 1,689 ක වටිනාකම, පිරිවැයට සහ රක්ෂණ ආයතනය විසින් රක්ෂණය කළ වටිනාකම් පදනම් කර ගෙන රු.මිලියන 7,108.9 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | මාර්ග සංවර්ධන අධිකාරිය සතු වාහන සම්බන්ධව රක්ෂණාවරණය ලබාගැනීමට යාමේදී එකී වාහන සම්බන්ධව විධිමත් තක්සේරු වටිනාකම් තීරණය කර රක්ෂණාවරණය ලබා ගනී. මෙම වෘත්තිමය තක්සේරුව වරලත් ඉංජිනේරුවරුන්ගෙන් සමන්විත අධිකාරියේ කමිටුවක් මගින් සිදුකෙරේ. | ප්‍රමිතය අනුව, සුදුසුකම්ලත් තක්සේරුකරුවන් විසින් වාහන ප්‍රවර්තන වෙළඳපොළ මිල ගණන් අනුව සාධාරණ අගයට තක්සේරු කළයුතු බව. |
| (ඉ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 58 වගන්තිය අනුව අස්තිත්වයේ දේපළ, පිරියත හා උපකරණ වල ප්‍රධාන අංගයන්හි ඵලදායී ජීවිත කාලය එකිනෙකට වෙනස් වන විට එම අංගයන් එකිනෙකට වෙනස් වූ ක්ෂය අනුපාතයක් මත ක්ෂය කළ යුතුය. එසේ වුවත් අධිකාරියේ මුළු වත්කම් වලින් සියයට 63 ක් නියෝජනය කරන එකිනෙකට වෙනස් වූ ඵලදායී ජීවිත කාලයන් සහිත අධිවේගී මාර්ග වල බොක්කු, මාර්ග ඉවුරු, මාර්ග පෘෂ්ඨය, මාර්ග සංඥා ඇතුලු විවිධ අංගයන් සඳහා වෘත්තීමය තක්සේරුවක් මත ක්ෂය අනුපාත තීරණය කිරීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණු අතර එකම ක්ෂය අනුපාතයක් යටතේ ක්ෂය කර තිබුණි. ඒ අනුව එම වත්කම්වල සැබෑ වටිනාකම මූල්‍ය ප්‍රකාශන වලින් නිරූපණය නොවුනි. | ශ්‍රී ලංකා මාර්ග වත්කම් කළමනාකරණ පද්ධතිය තුලින් මේ සඳහා ක්‍රමානුකුල ප්‍රවේශයක් සඳහා වත්කම් තක්සේරු පද්ධති මොඩියුලය සංවර්ධනය කිරිමේ කටයුතු මේ වන විට ආරම්භ කර ඇත. | අධිවේගී මාර්ගවල එක් එක් කොටස් ප්‍රමිතය අනුව සුදුසු අනුපාත යටතේ ක්ෂයකල යුතු බව. |
| (ඊ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි ඡේද අංක 51 අනුව, වත්කම් ප්‍රත්‍යාගණනයේ දී වත්කම් පන්තියම ප්‍රත්‍යාගණනය කළ යුතු වුවත්, එයට පටහැනිව අධිකාරියට අයත් ගොඩනැගිලි 632 න් ගොඩනැගිලි 262 ක් පමණක් 2022 වර්ෂය අවසන් වන විට ප්‍රත්‍යාගණනය කර ගිණුම් ගත කර තිබුණි. | අධිකාරිය සතු ගොඩනැගිලි පන්තියම තක්සේරු දෙපාර්තමේන්තුව වෙතින් තක්සේරු කිරීමේ කටයුතු දැනටමත් සිදුකරමින් පවතී. | ප්‍රමිතය අනුව වත්කම් ප්‍රත්‍යාගණනයක් සිදු කරන විට මුළු වත්කම් පන්තියම ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (උ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 13 හි 09 ඡේදය අනුව, ආයෝජන වත්කමක් ලෙස හඳුනා ගත යුතු රු.මිලියන 40 ක් වූ බොරැල්ල උමං මාර්ගය තුළ පිහිටි කඩ කාමර 20 ක් සහ පාලිත සමාගම් 02 ක් වෙත බදු දී තිබූ ඉඩම්වල වටිනාකම් ආයෝජන වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි. | බොරැල්ල උමං පදිකමාරුවේ පවතින කඩකාමර වලට අදාලව ආයෝජන වත්කමක් ලෙස දැක්වීම පිළිබඳව අනුකූලතාවයක් ඉදිරියේදී ගනු ලැබේ. | ප්‍රමිතය පරිදි ආයෝජන වත්කම් නිවැරදිව හඳුනා ගත යුතු බව. |
| (ඌ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිත අංක 14 හි 16 ඡේදය අනුව, සම්බන්ධිත පාර්ශවයන් පිළිබඳ විස්තර හා සම්බන්ධිත පාර්ශව සමඟ වූ ගණුදෙනු මූල්‍ය ප්‍රකාශවල හෙළිදරව් කර නොතිබුණි. | ශ්‍රී ලංකා අංශ ගිණුම්කරන ප්‍රමිත අංක 14 හි 16 අනුව සම්බන්ධිත පාර්ශවයන් හෙළිදරව් කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | ප්‍රමිතය පරිදි සම්බන්ධිත පාර්ශව හා ඒ සමඟ වූ ගනුදෙනු හෙළිදරව් කළ යුතු බව. |
| (එ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 30 වන ඡේදය අනුව, වැඩ නිම කිරීමේ අදියර මත (Stage of Completion) සේවාදායක කොන්ත්‍රාත් ආදායම හඳුනාගත යුතු වුවත්, එයට පටහැනිව අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂයේ දී රු.මිලියන 107.28 ක් සම්පූර්ණයෙන් අවසන් වූ වැඩ පදනම මත ආදායම් ලෙස හඳුනාගෙන තිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ප්‍රමිත අංක 16 හි වගන්ති අංක 33 ට අනුව ගිණුම් තබන අතර සලකා බලන කාල පරිච්ඡේදය සඳහා සේවාදායක වැඩ නිම කරනු ලබන ප්‍රමාණය අනුව ආදායම හඳුනා ගැනීම සිදුකරනු ලබයි. | ප්‍රමිතය පරිදි වැඩ නිම කිරීමේ අදියර මත ආදායම හඳුනා ගැනීමෙන් ආදායම් වියදම් සාධාරණව මූල්‍ය ප්‍රකාශනවල නිරූපණය කළ යුතු බව. |
| (ඒ) | ශ්‍රී ලංකා අංශ ගිණුම්කරන ප්‍රමිත අංක 19 හි 141 (ග) ඡේදය අනුව, සේවක ප්‍රතිලාභ ගණන කිරීමේ දී වාර්තාකරණ දිනයට භාවිතා කළ ප්‍රධාන ආයුගණන උපකල්පන මත වට්ටම් අනුපාතය, වට්ටම් අනුපාතය තීරණය කළේ කුමන පදනමට ද, හා වැටුප් වැඩිවීම්වල අපේක්ෂිත අනුපාතිකය ඇතුළු භාවිතා කළ වෙනත් ප්‍රමාණාත්මක උපකල්පන මූල්‍ය ප්‍රකාශනවන හෙළිදරව් කළ යුතු වුවද, මූල්‍ය ප්‍රකාශන තුළ එවැනි කිසිදු හෙළිදරව් කිරීමක් සිදු කර නොතිබුණි. | ඉදිරියේදී මූල්‍ය ප්‍රකාශන වල සේවක ප්‍රතිලාභ ගණනය කිරීමේ දී යොදාගනු ලබන උපකල්පන හෙළිදරව් කිරීමට කටයුතු කරනු ලැබේ. | ප්‍රමිතයේ ප්‍රතිපාදන පරිදි මූල්‍ය ප්‍රකාශ පරිශීලකයන්ගේ දැන ගැනීම පිණිස සහ එහි සාධාරණ බව නිරූපණය සඳහා අදාළ තොරතුරු හෙළිදරව් කළ යුතු බව. |

### 1.5.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මාර්ග සංවර්ධන අධිකාරියේ නිත්‍ය විෂය පථයට පරිබාහිරව දේශීය බැංකු මගින් අරමුදල් සම්පාදිතව, ග්‍රාමීය මාර්ග ව්‍යාපෘති ඒකකය මගින් ජාතික, ප්‍රාදේශීය හා ග්‍රාමීය වශයෙන් කිලෝමීටර් 100,000 ක විකල්ප මාර්ග පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. ව්‍යාපෘතිය යටතේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අර්ධ වශයෙන් නිමකළ ජාතික මහා මාර්ග වලට අයත් නොවන මාර්ග වෙනුවෙන් වැය කරන ලද රු.මිලියන 125,586 ක් කෙරීගෙන යන වැඩ (WIP) ලෙස හඳුනාගෙන තිබුණි. මෙම ඉදිකිරීම් පූර්ණ වශයෙන් නිමකිරීමෙන් අනතුරුව වියදම් ලෙස ලියාහරින | කි.මී.100000 විකල්ප මාර්ග පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතියට අදාල ගිණුම්කරණ ක්‍රියාවලිය ගිණුම් ප්‍රතිපත්ති යටතේ හෙළිදරව් කර ඇත.<br>ආදායම සහ වියදම අදාල කාල පරිච්ඡේදයට ගැලපුම් කරනු ලැබේ. | ප්‍රාග්ධන වියදම් අදාළ පරිදි වත්කම් භාරකාරීත්වය දරන ප්‍රාදේශීය සභා, නගර සභා ආදිය වෙත මාරු කළ යුතු වන බව. |

බව සහ මෙම වියදම් හේතුවෙන් අධිකාරියේ අතිරික්තයට හෝ ඌනතාවයට වන බලපෑම ව්‍යාපෘතිය සඳහා ලබාගත් ණය ආපසු ගෙවීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් ප්‍රදාන ලද පසු හිලව් කරන බවත් මූල්‍ය ප්‍රකාශන සමඟ වූ සටහන් වලින් හෙළිදරව් කර තිබුණි. මේ අනුව ආදායම හඳුනා ගැනීම හා වියදම් ලෙස ලියා හැරීම කාලපරිච්ඡේද දෙකක් තුළ හඳුනාගැනීම ගැලපුම් සංල්පයට පටහැනි බව නිරීක්ෂණය විය. තවද, මෙම ප්‍රාග්ධන වියදම් වත්කම්වල භාරකාරිත්වය දරන ආයතනවලට මාරු නොකිරීම නිසා රජයේ ගිණුම්වල ප්‍රාග්ධන වත්කම් ලෙස දැක්වුණද, අධිකාරිය විසින් පුනරාවර්තන වියදම් ලෙස ලියාහැර තිබුණි.

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධිකාරියට අයත් **A** සහ **B** ශ්‍රේණි වලට අදාළ මහා මාර්ගයන්ගේ මුළු දුර ප්‍රමාණය කිලෝමීටර් **12,225** ක් වුවත් ජාතික මහාමාර්ග ප්‍රාග්ධනිත කිරීම ආරම්භ කරන ලද 2018 වර්ෂයේ සිට 2022 දෙසැම්බර් 31 දිනට මාර්ග 285 කට අයත් කිලෝමීටර් 3,267 ක් පමණක් ප්‍රාග්ධනිත කර තිබුණි. ඒ අනුව, මාර්ග සංවර්ධන අධිකාරිය සතු **A** සහ **B** ශ්‍රේණි වලට අයත් කිලෝමීටර් 8958 ක දුර ප්‍රමාණය සඳහා වූ වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනවල දක්වා නොතිබුණු අතර, මෙය 2022 දෙසැම්බර් 31 දිනට සමස්ත මාර්ග පද්ධතියේ දුර ප්‍රමාණයෙන් සියයට 73 ක ප්‍රතිශතයක් විය. | මාර්ග ප්‍රාග්ධනිත කිරීම සඳහා යෝජිත ක්‍රියාකාරී සැලැස්මට අනුව ප්‍රවාහන සම්බන්ධතා හා වත්කම් කළමනාකරණ ව්‍යාපෘතිය (TCAMP) යටතේ දැනට පවතින සහ යෝජිත ක්‍රියාමාර්ග හඳුනාගෙන ඇත. | විවිධ විදේශීය සහ දේශීය ව්‍යාපෘති මඟින් මූල්‍යනය කරමින් ඉදිකරනු ලබන හා විටින් විට පුනරුත්ථාපනය කරනු ලබන මහා මාර්ග ප්‍රාග්ධනිත කර සුදුසු පරීක්ෂය කිරීම සඳහා අදාළ ක්‍රියාමාර්ග හඳුනාගෙන කඩිනමින් ක්‍රියාත්මක කළ යුතු බව. |
| (ආ) | අධිකාරිය විසින් මාර්ග සංවර්ධන කටයුතු වල දී අවතැන් වූවන් නැවත පදිංචි කිරීම සඳහා මිල දී ගනු ලැබූ අක්කර 07 ක ඉඩම්, විවිධ අවස්ථාවල මිලදීගෙන තිබූ පරිගණක තොරතුරු පද්ධතියක්, යතුරු පැදි **25** සහ වාහන **22** ක් ස්ථාවර වත්කම් ලෙස ගිණුම් ගත කර නොතිබීම හේතුවෙන් අධිකාරියේ වත්කම් රු.මිලියන 263.35 කින් ඌණ ගණනය වී තිබුණි. | මෙම ඉඩම් සම්බන්ධයෙන් තොරතුරු කැඳවා ඇති අතර එම තොරතුරු ලැබීමෙන් පසු අදාල ගැලපුම සිදු කරනු ලැබේ. | අධිකාරියට අයත් සියලු වත්කම් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු බව. |
| (ඇ) | විදේශාධාර ව්‍යාපෘති 08 ක මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දින වන විට අධිකාරිය වෙත භාර දී තිබුණු පිරිවැය රු.මිලියන 34,044.46 ක් වූ ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කර අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබීම හේතුවෙන් ස්ථාවර වත්කම් වටිනාකම ඌන ගණනය වී තිබුණි. | ව්‍යාපෘති 06 ක වත්කම් විධිමත් යාන්ත්‍රණයක් හරහා තක්සේරු කර ගිණුම් ගත කළ යුතුව ඇත. | ව්‍යාපෘති මගින් අධිකාරිය වෙත පැවරෙන වාහන, පරිගණක සහ ලී බඩු ආදී සියලු වත්කම් අධිකාරිය විසින් ගිණුම්ගත කර ඵලදායී උපයෝජනය සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළ මගනැගුම ඉමල්ෂන් සමාගමේ සියයට 99 ක සෘජු පාලන හිමිකමක් අධිකාරියට හිමි බව හෙළිදරව් කර තිබුණ ද, ඒ සඳහා වන කොටස් සහතික විගණනයට ඉදිරිපත් නොවූ අතර සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය තුල ද එම ප්‍රතිශතයට සමපාත නියෝජනයක් අධිකාරියට නොමැති බව නිරීක්ෂණය විය. තවද 2004 වර්ෂයේදී අදාල සමාගමේ රු.මිලියන 01 ක ආයෝජනයක් සිදුකල බව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල සඳහන් වුවද අදාල සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළ එය ණය මුදලක් ලෙස ගිණුම්ගතකර තිබුණි. | අදාළ සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයන් පත් කරනු ලබන්නේ අධිකාරියේ අධ්‍යක්ෂක මණ්ඩලය මගිනි. කොටස් සහතික කිහිපවතාවක් ඉල්ලා සිටිය ද මෙතෙක් එම සහතික අධිකාරිය වෙත ලැබී නොමැත. | අදාළ කොටස් සහතික ලබා ගැනීමට හා හිමිකම නියෝජනය වන පරිදි අධ්‍යක්ෂ මණ්ඩලය පත්කර ගැනීමට ද සමාගම විසුරුවා හැරීමට නියමිත බැවින් එයට පෙර හිමිකම පිළිබඳ ගැටලුව නිරාකරණය සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග අධිකාරිය විසින් ගත යුතු බව |
| (ඉ) | රේඛීය අමාත්‍යාංශයේ අදාළ වැය ශීර්ෂයන් සඳහා වෙන් කළ ප්‍රතිපාදන අවශ්‍ය පරිදි මහා භාණ්ඩාගාරයෙන් නොලැබීම හේතුවෙන් 2022 සැප්තැම්බර් 30 දින වන විට රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ඉල්ලීම පරිදි අධිකාරිය විසින් මහා මාර්ග අමාත්‍යාශය වෙත 2021 හා සමාලෝචිත වර්ෂයන්හිදී පිළිවෙලින් රු.මිලියන 494.2 ක් හා රු.මිලියන 1,470 ක් ලෙස එකතුව රු.මිලියන 1,964.2 ක මුදලක් ණය පදනම මත ලබා දී තිබුණු අතර අදාළ මුදල, මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු ණය මුදලක් ලෙස අධිකාරියේ ගිණුම්වල දක්වන ලෙසට රේඛීය අමාත්‍යාංශ ලේකම්වරයා විසින් 2022 අගෝස්තු 05 දින උපදෙස් ලබා දී තිබුණි. ඒ අනුව අධිකාරිය විසින් අදාළ මුදල් භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු මුදලක් ලෙස ගිණුම් ගත කර තිබුණි. | මාර්ග සංවර්ධන අධිකාරිය විසින් කළමනාකරණ ඒකකවලට ලබාදුන් මුදල ගිණුම්ගත කළ යුතු ආකාරය රේඛීය අමාත්‍යාංශ ලේකම්තුමා විසින් මුදල්, ආර්ථික, ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන් සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් උපදෙස් ඉල්ලා තිබුණද, අදාල උපදෙස් මෙතෙක් ලැබී නොමැත. | රේඛීය අමාත්‍යාංශයට ණය මුදලක් ලබා දීමට මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගත යුතු බව. |
| (ඊ) | මාර්ග පුළුල් කිරීම් හා වැඩි දියුණු කිරීමේ දී අත්කර ගත් ඉඩම් වලට අදාළව 38(අ) ගැසට් නිවේදනය නිකුත් කළ දින සිට වන්දි මුදලට අදාළ ප්‍රථම වන්දි ගෙවීම සිදු කරන දිනය දක්වා සියයට 07 ක වාර්ෂික පොළියක් අදාල වන්දි හිමියන් වෙත ගෙවිය යුතු වේ. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවීමට ඇති මුළු ව්‍යවස්ථාපිත වන්දි මුදල හා ඊට අදාළ පොළී මුදල අධිකාරිය විසින් හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | අදාළ වන්දි හා පොළී මුදල් ගෙවීම සඳහා ඒ ඒ ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ප්‍රතිපාදන ඉල්ලුම් කරන ලද කැබලි වලට අදාලව පමණක් ඉඩම් අංශයේ වවුචර්පත් සාදා ගෙවීම් කර ගිණුම්ගත කරනු ලැබේ. | ගෙවිය යුතු ව්‍යවස්ථාපිත වන්දි මුදල හා ඊට අදාළ පොළී මුදල නිවැරදිව ගණනය කර ගිණුම්ගත කළ යුතු බව. |
| (උ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට විවිධ ව්‍යාපෘති මඟින් අධිකාරිය වෙත පවරා දී තිබුණු පිරිවැය රු.මිලියන 33,770 ක් වූ හෙක්ටයාර් 2,099.41 ක් ඉඩම් ලෙස වෙනම හඳුනානොගෙන දේපළ පිරියත හා උපකරණ ලෙස ගිණුම්ගතකර තිබුණි. ඒ අනුව, වත්කම් සඳහා ක්ෂය වියදම් ගැලපීමේදී ඉඩම් වටිනාකම ඇතුළත් වීමේ අවධානමක් ද පැවතුනි. | මේ සම්බන්ධව කරුණු මූල්‍ය ප්‍රකාශන වල ගිණුම්කරන ප්‍රතිපත්ති සටහන් අංක 2.3 (iii) හි මෙම ඉඩම් වටිනාකම වෙන්කර දක්වා ඇති අතර ක්ෂය කිරීම් සිදු නොකරන බවද හෙළිදරව් කර ඇත. | ඉඩම් සඳහා ක්ෂය කිරීම් සිදු නොකරන බවට තහවුරු කර ගත යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ඍ) | අධිකාරිය විසින් සෘජුව ඉඩම් පවරා ගැනීම වෙනුවෙන් ගෙවීමට ඉදිරිපත් කළ වවුචර් පත් 105 ක් ද්විගණනය වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති ගෙවිය යුතු වන්දි හා පොලී වටිනාකම රු.මිලියන 34.42 කින් අධිගණනය වී තිබුණි. | 2022.12.31 දිනට ගෙවිය යුතු වන්දි හා පොලී වටිනාකම ගණනය කිරීමේදී පරිගණක දෝෂයකින් වවුචර් 105 ක් ද්වීගණනය වී ඇත. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී විධිමත් අධීක්ෂණයක් කළ යුතු වන බව. |
| (එ) | 2020 – 2021 වර්ෂයේ දී කි.මී. 100,000 ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ ග්‍රාමීය මාර්ග ඉදිකිරීමට, ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක වන “Inclusive Connectivity and Development” ව්‍යාපෘතිය මගින් සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු.මිලියන 2,112.11 ක් ලබා දී තිබුණ ද, එම වටිනාකම අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට හෝ ඒ පිළිබඳ හෙළදරව් කිරීමට කටයුතු කර නොතිබුණි. | ලෝක බැංකු ණය ආධාර යටතේ ක්‍රියාත්මක වන අන්තර්ගතිකව සම්බන්ධිත සංවර්ධන ව්‍යාපෘතිය මගින් ණය ගිවිසුම් ප්‍රකාරව ප්‍රතිමූල්‍යනය පහසුකම් යටතේ සමාලෝචිත වර්ෂය තුලදී රු. මිලියන 2,712.11ක මුදලක් ප්‍රතිපූර්ණය කර ඇත. | මූල්‍ය ප්‍රකාශන මගින් අදාළ වන හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතු බව. |
| (ඒ) | 2022 දෙසැම්බර් 31 දින වන විට රුවන්පුර අධිවේගී මාර්ග ව්‍යාපෘතිය යටතේ අධිකාරිය වෙත පවරා තිබූ රු.මිලියන 1,630.68 ක් වූ ඉඩම් අත්පත් කර ගැනීමේ වියදම් ප්‍රාග්ධනිත නොකිරීම හේතුවෙන් ඉඩම් වත්කම් එම අගයෙන් ඌණ ගණනය වී තිබුණි. | ඇවර කිරීමේ ගිණුම් ලද පසු එම වියදම් අධිකාරියේ පොත් වලට ගනු ලැබේ. | අත්පත් කරගත් ඉඩම් අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනයට ඇතුළත් කළ යුතු බව. |
| (ඔ) | සමාලෝචිත වර්ෂයේ ලද ස්ථාවර තැන්පතු සහ භාණ්ඩාගාර බිල්පත් පොලී ආදායම රු.මිලියන 1334.75 ක් වුවත් එය රු.මිලියන 1,400.34 ක් ලෙස ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබීම හේතුවෙන් ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය රු.මිලියන 65.59 ක් වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට සටහන් කර ගන්නා ලදී. | මූල්‍ය ප්‍රකාශන නිසි අධීක්ෂණයකින් යුතුව පිළියෙල කල යුතු බව. |
| (ඕ) | විදේශ ණය හා දේශීය වාණිජ බැංකු ණය මත ක්‍රියාත්මක ව්‍යාපෘතිවල අවශ්‍යතාවය සඳහා මිල දී ගන්නා සහ ව්‍යාපෘති අතරේ හුවමාරු වන ඉන්වෙන්ට්‍රි ගත විය යුතු වත්කම් මිල දී ගන්නා සහ හුවමාරු වන අවස්ථාවන් හි දී අධිකාරියේ ස්ථාවර වත්කම් ලේඛනයේ යාවත්කාලීනව සටහන් වන ක්‍රමවේදයක් සකස් කර නොතිබීම නිසා වත්කම් ඒකක 8,329 ක වටිනාකම මූල්‍ය ප්රකාශනවල දක්වා නොතිබුණි. | ව්‍යාපෘති සතු වත්කම් ඒ ඒ ව්‍යාපෘති අතර හුවමාරු කිරීම වළක්වමින් මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් විටින් විට චක්‍රලේඛ නිකුත් කර තිබුණද, එම චක්‍රලේඛයන්ට පටහැනිව ලේඛන වලට ඇතුලත් නොවී ව්‍යාපෘති වලට යොමුව ඇත. | සියලු වත්කම් ඉන්වෙන්ට්‍රිගත කර විධිමත් පරිදි මාරු කිරීම් කළ යුතු බව. |
| (ක) | සමාලෝචිත වර්ෂය අවසන් දිනට පැවති ශුද්ධ විලම්භිත වත්කම් ( **Net deferred assets**) වටිනාකම රු.මිලියන 65.61 ක් ණයගැති වටිනාකම යටතේ දැක්වීම හේතුවෙන් ණය ගැති වටිනාකම එම අගයෙන් අධිගණනය වී ජංගම නොවන වත්කම් වටිනාකම ඌනගණනය වී තිබුණි. | 2018 වසරේ සිට මේ දක්වාම විලම්භිත වත්කම් (Deferred Assets) වටිනාකම ණයගැති වටිනාකම යටතේ දක්වා ඇත. | විලම්භිත වත්කම් හා වගකීම් වෙනම අයිතමයක් යටතේ දැක්විය යුතු බව. |

### 1.5.4 නොසැසඳුනු පාලන ගිණුම් හෝ වාර්තා

| | විෂයය | මූලා ප්‍රකාශන අනුව වටිනාකම (රු.මි) | අනුරූපී වාර්තා අනුව වටිනාකම (රු.මි) | වෙනස (රු.මිලියන) | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| (අ) | ගොඩනැගිලි, යන්ත්‍රෝපකරණ ඇතුළු ජංගම නොවන වත්කම් | 961.71 | 815.74 | 145.96 | ශේෂයන් වල අසමානතාවයන් පරීක්ෂා කර අවශ්‍ය නිවැරදි කිරීම් ඉදිරියේදී සිදු කරනු ලැබේ. | අදාළ දෝෂය හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කළ යුතු බව. |
| (ආ) | මාර්ග සංවර්ධන අධිකාරිය සහ සී/ස මහ නැගුම මාර්ග ඉදිකිරීම් හා යන්ත්‍රෝපකරණ (පුද්) සමාගම අතර වූ ජංගම ගිණුම් අතර වෙනස. | 88.64 | 99.51 | 10.87 | මහ නැගුම සමාගම් වලින් තොරතුරු කැඳවුව ද අදාල තොරතුරු ලැබී නොමැත. | අදාළ සැසදීම් කාලීනව සිදුකර වෙනස්කම් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතු බව. |
| (ඇ) | අධිවේගී මාර්ග යටතේ ප්‍රාග්ධනිත කරන ලද ඉඩම් අත්පත් කර ගැනීමේ වියදම සහ ඉඩම් අංශය විසින් පවත්වාගෙන යන එම තොරතුර අතර වෙනස. | 33,815 | 17,169 | 16,646 | නිසි අධ්‍යයනයකින් පසුව සුදුසු ගිණුම් ප්‍රතිපත්තියක් හඳුන්වාදීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | තොරතුරු යාවත්කාලීන කර නිවැරදි බව තහවුරු කර ගත යුතු බව. |

### 1.5.5 අධිකාරී බලය නොලත් ගනුදෙනු

| | විෂය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2008 අංක 40 දරන ජාතික මංමාවත් පනතේ 13 හා 14 වැනි වගන්ති සහ 2011 නොවැම්බර් 18 දිනැති අංක 1732/12 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ 07 ඡේදය අනුව අධිවේගී මාර්ග ගාස්තු ලෙස එකතු කරනු ලබන මුදල් අධිකාරියේ අරමුදලට බැර කළ යුතු අතර, ගාස්තු අය කරන ජාතික මහා මාර්ග සංවර්ධනයට හා නඩත්තු සඳහා එම අරමුදල් භාවිතා කළ යුතුය. නමුත් එම කරුණු වලට පටහැනිව එලෙස එකතු වූ අරමුදල් වලින් රු. මිලියන 1,000 ක් සමාලෝචිත වර්ෂයේ දී මහා මාර්ග අමාත්‍යාංශය වෙත ලබා දී තිබුණි. | මහාමාර්ග අමාත්‍යාංශයේ ඉල්ලීම පරිදි අධ්‍යක්ෂ මණ්ඩල තීරණයන්ට අනුව රු. මිලියන 1000 ක මුදල නැවත ලබාගැනීමේ පදනම මත අධිවේගී මාර්ග ඉදිකිරීම වෙනුවෙන් මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය I හා රුවන්පුර අධිවේගී මාර්ග ව්‍යාපෘතිය වෙත ලබාදෙන ලදී. | ජාතික මංමාවත් පනතේ විධි විධාන අනුව කටයුතු කළ යුතු බව. |
| (ආ) | 2008 අංක 40 දරන ජාතික මංමාවත් පනතේ 4(3) වගන්තිය අනුව, මාර්ග සංවර්ධන අධිකාරිය, අදාළ පළාත් සභාව, අදාළ පළාත් පාලන ආයතන සහ | මේ සම්බන්ධයෙන් ගරු අමාත්‍යතුමා දැනුවත් කිරීමෙන් අනතුරුව අදාල කමිටු පිහිටුවීමට කටයුතු කර ඇත. | ජාතික මංමාවත් පනතේ විධිවිධාන අනුව ඒකාබද්ධ |

| | | | |
|---|---|---|---|
| | වෙනත් නියෝජිත ආයතන විසින් භාර ගෙන ඇති දිස්ත්‍රික්කයේ මාර්ග සංවර්ධන ව්‍යාපෘති නිශ්චිතව දක්වන "ඒකාබද්ධ මාර්ග පද්ධති සංවර්ධනය සහ නඩත්තුව සඳහා ක්‍රියාකාරී සැලැස්ම" සකස් කර නොතිබුණි. | ඉදිරියේදී කමිටුව විසින් ලබාදෙන උපදෙස් අනුව මේ සම්බන්ධයෙන් කටයුතු කිරීමට නියමිතය. | මාර්ග පද්ධති සංවර්ධනය සහ නඩත්තුව සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතු බව. |
| (ඇ) | 2005 නොවැම්බර් 03 දිනැති අංක: අමප/05/1711/016/110 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, මාර්ග නඩත්තු කිරීමේ භාරකාර අරමුදලක් පිහිටු වීමට කටයුතු කර නොතිබුණි. | රේඛීය අමාත්‍යාංශය සහ මාර්ග සංවර්ධන අධිකාරිය මෙම අමාත්‍ය මණ්ඩල තීරණය ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කරනු ලැබේ. | අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි මාර්ග නඩත්තු කිරීමේ භාරකාර අරමුදල පිහිටු විය යුතු බව. |

### 1.5.6 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරිය, එහි පරිපාලිත සමාගම් වන සී/ස මගනැගුම ඉමල්ෂන් නිෂ්පාදන (පුද්) සමාගම, සී/ස මගනැගුම උපදේශන හා ව්‍යාපෘති කළමනාකරණ සේවා (පුද්) සමාගම, සී/ස මගනැගුම මාර්ග ඉදිකිරීම් හා යන්ත්‍රෝපකරණ (පුද්) සමාගම හා සී/ස අධිවේගී මාර්ග ප්‍රවාහන (පුද්) සමාගම යන සමාගම්වල මූල්‍ය ප්‍රකාශන ඒකාබද්ධ කර සමූහයට අදාළ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි. | පරිපාලිත සමාගම්වල මූල්‍ය ප්‍රකාශන ඒකාබද්ධ කර සමූහයට අදාල ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබීම සම්බන්ධයෙන් කරුණු ගිණුම් ප්‍රතිපත්ති වල සටහන් අංක 2.2 හි දක්වා ඇත. | අධිකාරිය විසින් පරිපාලිත සමාගම්වල මූල්‍ය ප්‍රකාශන ඒකාබද්ධ කර සමූහය සඳහා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කල යුතු බව. |

### 1.5.7 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන වල ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබුණු රු. මිලියන 767,872.2 වටිනා ඇක්රෝ අයිතම (Acroew Item), අධිවේගී මාර්ග | කේවළ වත්කම් ලේඛණ, අධිවේගී මාර්ග වටිනාකම රාජ්‍ය ප්‍රධාන ලෙස සටහන් කිරීමට භාණ්ඩාගාරයෙන් ලද එකඟතාවය | අදාල වත්කම් හැර අනෙකුත් වත්කම් ලේඛන CD තැටියක් මගින් ලබාදී ඇත. අධිවේගී මාර්ග හා අනෙකුත් ව්‍යාපෘති නිමවීමෙන් පසු අදාල රේඛීය අමාත්‍යාංශය විසින් එම වත්කම් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත නීත්‍යානුකූලව පැවරීම සිදුකල යුතු බව දන්වා ඇත. | අදාළ විස්තරාත්මක ලේඛණ අධිකාරිය විසින් පවත්වාගෙන යා යුතු බව සහ අවශ්‍ය වූ විට විගණනයට ඉදිරිපත් කළ යුතු බව. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මාර්ග සංවර්ධන අධිකාරිය සතු යන්ත්‍රෝපකරණ කුලියට දීම, කඩ කාමර කුලියට දීම, මාර්ග රක්ෂිත භාවිත කිරීම හා මාර්ග රක්ෂිතවල ප්‍රචාරණ කටයුතු සිදුකිරීම වෙනුවෙන් බාහිර ආයතන 28 කින් හා පුද්ගලයින් 05 දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විට අයවිය යුතු හිඟ කුලී ආදායම් රු.මිලියන 50.07 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ වන විට රු.මිලියන 4.09 ක් අයකරගෙන ඇති අතර ඉතිරිය අයකර ගැනිමට කටයුතුකරමින් පවතී | ලැබිය යුතු මුදල් අයකර ගැනීමට කඩිනමින් කටයුතු කල යුතු බව. |
| (ආ) | මාර්ග සංවර්ධන අධිකාරියේ කාර්යය මණ්ඩලයේ නිලධාරීන් 290 ක් සමාලෝචිත වර්ෂය තුළ දී ව්‍යාපෘති කාර්යාල 18 ක සේවයේ යොදවා තිබුණු අතර, අදාළ කාර්යය මණ්ඩලය සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය විසින් රු.මිලියන 65.1 ක වැටුප් ගෙවා තිබුණි. එසේ වුව ද, අදාළ වැටුප් ප්‍රතිපූර්ණය කර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණු අතර, ලැබිය යුතු මෙම ව්‍යාපෘති 18 න් ව්‍යාපෘති 07 ක වැඩ සමාලෝචිත වර්ෂය අවසන් වන විට අවසන් කර තිබුණි. | මාර්ග සංවර්ධන අධිකාරියේ ව්‍යාපෘතිවලින් 2023 ජනවාරි මාසය තුලදී රු. මිලියන 6.6 ක මුදලක් ලැබී ඇති අතර ඉතිරි මුදල් නිරවුල් කිරීමට කටයුතු කරන මෙන් අදාල ව්‍යාපෘති වලින් ඉල්ලීම් කර ඇත. | ව්‍යාපෘති කාර්ය මණ්ඩල වලට මුදල් ප්‍රතිපූර්ණයකර ගැනීමට කඩිනමින් කටයුතු කල යුතු බව. |
| (ඇ) | 2020, 2021 වර්ෂයන්ට අදාළව මාර්ග කි.මී.100,000 වැඩසටහන යටතේ ප්‍රසම්පාදන හා තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයින් වෙත 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ ප්‍රතිපාදන ඉක්මවා ගෙවා තිබුණු රු. මිලියන 6.19 ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි. තවද, අදාළ ශේෂය තුළ අධිකාරියේ සේවය කර විශ්‍රාම ගිය නිලධාරියකුගෙන් අයවිය යුතු රු.මිලියන 3.03 ක් ද ඇතුළත්ව තිබුණි. | මෙම මුදල ගෙවන ලෙසට අදාළ නිලධාරීන් දැනුවත්කර ඇති අතර එයට අතිරේක වශයෙන් ඉදිරියේදී ගෙවීමට හිමිකම් ලබන මුදලින් අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ ප්‍රතිපාදන ඉක්මවා කටයුතු නොකළ යුතු බව හා වැඩිපුර ගෙවන ලද මුදල් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු බව. |
| (ඈ) | මාර්ග සංවර්ධන අධිකාරිය සහ එහි පරිපාලිත සමාගම් අතර සිදුවන ගනුදෙනු වාර්තා කිරීමට පවත්වාගෙන යනු ලබන අන්තර් සමාගම් ගිණුම්වල වර්ෂ 02 ඉක්මවූ රු.මිලියන 107.17 ක් සහ වර්ෂ 05 ඉක්මවූ රු.මිලියන 314.58 ක් අධිකාරියට ලැබිය යුතු ලෙස දක්වා තිබුණද අදාළ ශේෂයන් නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. | පවතින නොගැලපීම් සම්බන්ධයෙන් අදාල සමාගම් සමඟ සාකච්ඡා කර ඇති අතර ඒවා නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතී. | අන්තර් සමාගම් ගිණුම් ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු බව. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් විලම්භිත නිමැවුම් බදු (Differd output tax) රු.මිලියන 79.58 ක් වූ | විලම්භිත නිමැවුම් බදු (Differd output tax) රු.මිලියන 79.58 න් රු.මිලියන 19.69 ක් පියවා ඇත. | අදාළ ශේෂයන් නිරවුල් කිරීම සඳහා කටයුතු |

| | | | |
|---|---|---|---|
| | අතර, මෙම ශේෂය තුළ වර්ෂ 5 ට වැඩි කාලයක සිට පැවත එන ශේෂයන්ගේ එකතුව රු.මිලියන 35 ක් වුවත් වර්ෂය අවසානය දක්වාම අදාළ ශේෂ නිරවුල් කිරීමට කටයුතුකර නොතිබුණි. | දක්ෂිණ අධිවේගී මාර්ග මෙහෙයුම් නඩත්තු හා කළමනාකරණ ඒකකයට අදාල වටිනාකම පියවීමට කටයුතු කරමින් පවතී. | කළ යුතු බව. |
| (ආ) | 2011 සිට 2020 වර්ෂ දක්වා කාලය තුළ රු.මිලියන 16.5 කට අදාළ භාණ්ඩ හා සේවා සැපයීම් සඳහා ලබාදුන් මුදල් තැන්පතු සහ අත්තිකාරම් පියවීමට හෝ මුදල් ආපසු ලබා ගැනීමට කටයුතුකර නොතිබුණි. තවද, මෙම ශේෂය තුළ 2011 වර්ෂයේ දී දක්ෂිණ අධිවේගී මාර්ගය විවෘත කිරීමේ උත්සවය සංවිධානය කිරීම සඳහා දරන ලද වියදමෙන් සියයට 50 ක වටිනාකම වූ රු.මිලියන 5 ක් ද ඇතුළත්ව තිබුණි. | 2011 සිට 2020 වර්ෂ දක්වා කාලය තුල ලබාදී ඇති උපලේඛණ 87 , 90 , 92 සහ 95 හි සඳහන් අත්තිකාරම් මුදල්වල එකතුව රු.මිලියන 16.5 කි. මේ වනවිට මෙම අත්තිකාරම් මුදල් පියවීමට කටයුතු කරන මෙන් අදාල අංශ ප්‍රධානීන් දැනුවත් කරමින් පවතී. | අත්තිකාරම් පියවීමට හෝ මුදල් ආපසු අයකර ගැනීමට කටයුතු කළ යුතු බව. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) | රෙගුලාසි අංක 104 - 108 | • අලාභානියක් සිදු වූ විට, අලාභානියේ ප්‍රමාණය හා හේතු වූ කරුණු නිශ්චය කිරීමටත් ඊට අදාළ වගකිවයුත්තන් හඳුනා ගැනීමටත් පරීක්ෂණ ආරම්භ කළ යුතු වේ. එසේ වුවද විගණනයට ඉදිරිපත් වූ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය තුළ දී සිදු වූ රිය අනතුරු 121 ක් සම්බන්ධයෙන් අධිකාරියට සිදු වූ අලාභ සහ ඊට වගකිවයුතු පාර්ශව හඳුනා ගැනීමට කටයුතුකර නොතිබුණු අතර මූලික විමර්ශන 02 ක් පමණක් පවත්වා තිබුණි. | ඉදිරියේ දී සියලු රිය අනතුරු සඳහා මූලික විමර්ශන සිදු කිරීමට අදාල අංශ දැනුවත් කර චක්‍රලේඛයක් නිකුත් කරන ලදී | මුදල් රෙගුලාසි වලට අනුව පාඩු හා හානි සම්බන්ධයෙන් කටයුතු කළ යුතු බව. |
| | | • මාර්ග සංවර්ධන අධිකාරිය විසින් මහ නැගුම මාර්ග ඉදිකිරීම් හා යන්ත්‍රෝපකරණ සමාගම වෙත ලබා දී තිබූ කැබ් රථ 02 ක් 2022 මැයි 09 වන දින සිදු වූ කලහකාරී සිදුවීම් හේතුවෙන් පූර්ණ හානියට පත් වී තිබුණු අතර ඒ සඳහා ඇස්තමේන්තුගත රක්ෂණ වන්දි මුදල රු.මිලියන 27.5 ක් වුවත් අදාළ වන්දි මුදල සමාලෝචිත වර්ෂය අවසාන | 2022 මැයි 09 දින සිදු වූ කලහකාරී සිදුවීම හේතුවෙන් පූර්ණ හානියට පත් එම වාහන දෙක සම්බන්ධව පොලිසිය මගින් මහාධිකරණයේ නඩු පවරා ඇති අතර පූර්ණ හානි වශයෙන් හිමිකම ලබා ගැනීමට අධිකාරියේ අධ්‍යක්ෂ | මුදල් රෙගුලාසි අනුව වගකිව යුතු නිලධාරීන් නිශ්චය කළ යුතු බව. |

| | | | | |
|---|---|---|---|---|
| | | වන විටත් ලැබී නොතිබුණි. තවද, මුදල් රෙගුලාසි ප්‍රකාරව අලාභානියේ ප්‍රමාණය හා හේතු වූ කරුණු නිශ්චය කිරීමටත් වගකිවයුත්තන් හඳුනා ගැනීමටත් පරීක්ෂණ ආරම්භ කළ යුතු වුවද, ඒ අනුව කටයුතුකර නොතිබුණි. | මණ්ඩලය අනුමැතියද ලබාගන්නා ලදී. | |
| (ii) | මුදල් රෙගුලාසි 135(4) | මූල්‍ය බලතල පැවරීමේ ලේඛනය නියමිත කාලයකට වරක් ප්‍රතිශෝධනය කළ යුතු වුවත්, අධිකාරිය විසින් එම ලේඛණය 2020 වර්ෂයෙන් පසුව යාවත්කාලීනකර නොතිබුණි. | මේ වනවිට යාවත්කාලීන කරමින් පවතින අතර 2023 වසරේ ජූලි මස වන විට අවසන් කිරීමට අපේක්ෂිතය. | මුදල් රෙගුලාසි පරිදි මූල්‍ය බලතල බෙදීම වාර්ෂිකව සිදු කළ යුතු බව. |
| (ආ) | ආයතන සංග්‍රහයේ VIII වැනි පරිච්ඡේදයේ 10 වගන්තිය | රජයේ නිවාඩු දිනයක වැඩ කිරීම වෙනුවෙන් නිවාඩු දින වැටුප් ගෙවීම් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයෙන් ආවරණය නොවන කරුණු ආයතන අධ්‍යක්ෂකගෙන් විමසිය යුතු වුවත්, එසේ නොමැතිව, කාර්යාල සේවය සඳහා අනුයුක්ත කර ඇති නිලධාරින් ද සේවා අවශ්‍යතාවය මත කාර්යාල වේලාවෙන් පසුව සේවයේ යෙදුණු පැය ගණනේ එකතුව ගණනය කර පැය 08 ක කාලයක් සඳහා එක් නිවාඩු දිනයක් ලෙස සලකා නිවාඩු දින වැටුප් ගෙවීම් සිදුකර තිබුණි. ඒ අනුව, අධිවේගී මාර්ග මෙහෙයුම්, නඩත්තු හා කළමනාකරණ අංශයට අනුයුක්තව සේවය කරනු ලබන මාණ්ඩලික නිලධාරින් සඳහා 2022 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාල පරිච්ඡේදය සඳහා රු.මිලියන 6.84 ක නිවාඩු දින දීමනා පවත්නා ප්‍රතිපාදනවලට පටහැනිව ගෙවා තිබුණි. | මෙම විගණන ඡේදය හා එකඟ වේ. | ආයතන සංග්‍රහයේ විධිවිධාන පමණක් දීමනා ගෙවිය යුතු බව. |
| (ඇ) | 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතේ 20 වන වගන්තිය | ජීවන වියදම් දීමනාවට අමතරව, අධිකාරියටම සුවිශේෂී වූ, විවිධ පරමාර්ථයන් සහිතව ගෙවනු ලබන මාර්ග සංවර්ධන අධිකාරී දීමනාව, අතිරේක වැඩ දීමනාව, ගැලපුම් දීමනාව හා ඉංජිනේරු දීමනාව ඇතුළු දීමනාවන් 12 ක් සැලකිල්ලට ගෙන පාරිතෝෂික ගණනය කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අදාළ පාරිතෝෂික වෙන් කිරීම් වටිනාකම රු.මිලියන 1,232.83 කින් අධි ගණනය වී තිබුණි. තවද, අනුමත නොවන දීමනා ඇතුළත්ව පාරිතෝෂික ගෙවීම් කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දී රු.මිලියන 40.92 ක් වැඩියෙන් ගෙවා තිබුණි. | මාර්ග සංවර්ධන අධිකාරිය විසින් පාරිතෝෂික ගෙවීම් කිරීමේදී සේවක අර්ථසාධක අරමුදල සඳහා දායක මුදල් ගණනය කිරීමට ජීවන වියදම් දීමනාවට අමතරව දීමනා 04 ක් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත අදාළකරගෙන ඇත. | පාරිතෝෂික ගෙවීම් පනතේ විධිවිධාන අනුවම ක්‍රියා කළ යුතු බව. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | | | |
| | 1 වගන්තිය | අධිකාරිය විසින් මානව සම්පත් සංවර්ධනය කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබුණ අතර කාර්ය මණ්ඩලය සඳහා වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කිරීමට හෝ කාර්ය සාධනය ඇගයීමේ ක්‍රමවේදයක් හඳුන්වා දීමට කටයුතු කර නොතිබුණි. | බඳවා ගැනීමේ පටිපාටිය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පරිදි කාර්ය සාධන ගිවිසුම් අත්සන් කළ යුතු අතර, ඇගයීම් ක්‍රමයක් භාවිතා කළ යුතු බව. |
| | 5 වගන්තිය | මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | සේවක එක් රැස් කිරීමේ හා සම්පත් දායකයින් කැඳවීමේ ප්‍රායෝගික ගැටළු පැවතුනි. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව මානව සංවර්ධන සැලැස්මක් සකස්කල යුතු බව. |
| (ඉ) | කළමනාකරණ සේවා චක්‍රලේඛ | | | |
| (i) | 2006 සැප්තැම්බර් 22 දිනැති චක්‍රලේඛ අංක 30 හි ඇමුණුම II ඡේද අංක 04 | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ නියමයන්ට හා මාර්ගෝපදේශයන්ට අනුව සකස් කරන ලද බඳවාගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියක් සකසා ගැනීමට යටත්ව එම දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත්කර තිබූ කාර්යමණ්ඩල ප්‍රතිව්‍යුහගතකරණ නිර්දේශයන් ක්‍රියාත්මක නොකර අධිකාරිය විසින් තනතුරු 14 කට නිලධාරීන් 259 දෙනෙකු බඳවාගෙන තිබුණි. මෙම නිලධාරීන් වෙනුවෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර තිබුණු වැටුප් පරිමාණවල මූලික වැටුපට වඩා වැඩි වැටුප් පරිමාණවල පිහිටුවා වැටුප් ගෙවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දී රු.මිලියන 56.78 ක් වැටුප් ලෙස වැඩියෙන් ගෙවා තිබුණි. | ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කාණ්ඩයට අදාල වැටුප් කේතයන් සහ වැටුප් ව්‍යුහයන් අධ්‍යක්ෂ ජෙනරාල්ගේ සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතීන් පදනම්ව ලබා දී ඇත. | කළමනාකරණ සේවා චක්‍රලේඛ අනුව බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියක් සකස් කර ගත යුතු බව හා තනතුරු සඳහා අනුමත කරන ලද වැටුප් පරිමාණ වලට වඩා වැඩි වැටුප් පරිමාණ නොගෙවිය යුතු බව. |
| (ii) | 2006 අගෝස්තු 01 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 28 (II) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත නොකළ තනතුරු 12 ක් සඳහා නිලධාරීන් 51 දෙනෙකු බඳවාගෙන සමාලෝචිත වර්ෂය තුළ දී රු.මිලියන 23.6 ක් වැටුප් ලෙස ගෙවා තිබුණි. | තනතුරු 06 කට අදාළ තනතුරු හා සේවක සංඛ්‍යාව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර ඇති අතර, වැටුප් කේතයන් | කළමනාකරණ සේවා චක්‍රලේඛ අනුව අනුමත නොකළ තනතුරු සඳහා බඳවා ගැනීම් |

| | | | |
|---|---|---|---|
| | | පමණක් අනුමත කර නොමැත. අනෙක් තනතුරු 06 කට අදාළ තනතුරු, වැටුප් කේත හා සංඛ්‍යාව අනුමත කර නොමැත. | සිදු නොකළ යුතු බව. |
| (ඊ) 2021 නොවැම්බර් 16 දිනැති රජය සතු ව්‍යවසායන් සඳහා වන මාර්ගෝපදේශ සංග්‍රහය | | | |
| (i) 3.2 වගන්තිය, | බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය සඳහා (Scheme of Recruitment) අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහ රේඛීය අමාත්‍යාංශයේ නිර්දේශ සහිතව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතු වුව ද, අධිකාරියේ බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය සඳහා එවැනි අනුමැතියක් ලබා ගෙන නොතිබුණි. එසේම මෙම තත්ත්වය 2005 වර්ෂයේ සිට පැවතුනි. | මාර්ග සංවර්ධන අධිකාරිය සඳහා වන නව බඳවාගැනීමේ පටිපාටිය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇතත් ඒ සඳහා මෙතෙක් අනුමැතිය ලැබී නොමැත. | රජය සතු ව්‍යවසායන් සඳහා වන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතුය. |
| (ii) 3.3 වගන්තිය | අධිකාරිය විසින් පිළියෙල කරනු ලබන උපාය මාර්ගික සැලැස්මෙහි ආයතනයේ එක් එක් අංශයේ (Divisions of the SOE) සේවක අවශ්‍යතාවය, මානව සම්පත් සැලැස්මක් ආකාරයෙන් (Human Resource Plan) දැක්විය යුතු වුව ද එවැනි ආංශික සේවක අවශ්‍යතාවයන් හඳුනාගෙන නොතිබුණි. | බඳවාගැනීමේ පටිපාටිය අනුමත කරගැනීමට සහ මෙම අධිකාරිය සංවිධාන ව්‍යුහය ප්‍රතිව්‍යුහගත කිරීමට සමගාමීව ඉදිරියේදී සිදු කරනු ලබයි. | රජය සතු ව්‍යවසායන් සඳහා වන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ සමස්ත මෙහෙයුම් ප්‍රතිඵලය රු. මිලියන 5,488 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.මිලියන 78,864 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.මිලියන 73,376 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ව්‍යාපෘති වැඩ නිම කිරීමෙන් අනතුරුව එම ව්‍යාපෘතිවල වත්කම් ප්‍රාග්ධනිත කිරීමට අදාලව ලද ප්‍රාග්ධන ප්‍රදාන පෙර වසරට සාපේක්ෂව රු.මිලියන 64,079 කින් අඩුවීම සහ මූල්‍ය පිරිවැය රු.මිලියන 37,983 කින් ඉහලයාම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි. කෙසේ නමුත් පුනරාවර්තන වියදම් සඳහා රේඛීය අමාත්‍යාංශය හරහා ලද ප්‍රදාන පෙර වසරට සාපේක්ෂව රු. මිලියන 24,978 කින් ඉහල ගොස් තිබුණි.

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අධිකාරිය විසින් නොපියවා ඇති සමස්ථ ණය ශේෂය රු.මිලියන 356,058 ක් වූ අතර එය රු.මිලියන 264,893 ක බැංකු ණය වලින් හා රු.මිලියන 91,166 ක ණයකර වලින් සමන්විත විය. මාර්ග කිලෝමීටර් 100,000 වැඩසටහන, මධ්‍යම අධිවේගී මාර්ගය ඉදිකිරීම, මහා මාර්ග පුළුල් කිරීම හා වැඩිදියුණු කිරීම හා අධිකාරියේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා වෙනුවෙන් මෙම ණය ලබාගෙන තිබූ අතර ණය සඳහා පොළිය බර තබන ලද ප්‍රාථමික ණය අනුපාතයට උපරිම වශයෙන් සියයට 2 සිට 2.8 වැනි පරාසයක අගයක් එකතුකොට නියම කොට තිබුණි. මෙම සියලු ණය ලබා ගැනීමේ දී භාණ්ඩාගාර ඇපකර නිකුත් කර තිබුණි.

## 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

| අයිතමය | අනුරූපී වසරට සාපේක්ෂව වෙනස් වීමේ ප්‍රතිශතය | පෙර වසරට සාපේක්ෂව වෙන්ස්වීමේ ප්‍රවනතාවය |
|---|---|---|
| පුනරාවර්ථන ප්‍රදාන | 30 | වැඩිවීමකි |
| ප්‍රාග්ධන ප්‍රදාන | 78 | අඩුවීමකි |
| ශුද්ධ අධිවේගී මාර්ග ආදායම | 81 | අඩුවීමකි |
| සංවර්ධන හා නඩත්තු වියදම | 43 | අඩුවීමකි |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

i. සමාලෝචිත වර්ෂයට අදාළ දේශීය බැංකු ණය පොලිය පියවීමට ලැබිය යුතු ප්‍රදාන රු.මිලියන 34,844 කින් වැඩිවීම පුනරාවර්ථන ප්‍රදාන සියයට 30 කින් ඉහලයාමට හේතු වී තිබුණි.

ii. ව්‍යාපෘති වැඩ නිම කිරීමෙන් අනතුරුව එම ව්‍යාපෘතිවල වත්කම් ප්‍රාග්ධනිත කිරීමෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන පෙර වසරට සාපේක්ෂව රු.මිලියන 64,079 කින් අඩුවීම ප්‍රාග්ධන ප්‍රදාන සියයට 78 කින් අඩුවීම කෙරෙහි හේතු වී තිබුණි.

iii. සමාලෝචිත වර්ෂයේ අධිභාර බද්ද සහ මූල්‍ය පිරිවැය ඉහළයාම හා ඉන්ධන සීමාවීම හේතුවෙන් අධිවේගී මාර්ග භාවිතය සීමාවීම ශුද්ධ අධිවේගී මාර්ග ආදායම සියයට 81 කින් පහල යාමට හේතු වී තිබුණි.

**iv.** නඩත්තු හා වැඩිදියුණු කිරීම් සඳහා රේඛීය හා රාජ්‍ය අමාත්‍යාංශ හරහා ලද ප්‍රදාන පෙර වසරට සාපේක්ෂව රු. මිලියන 13,591 කින් අඩුවීම සංවර්ධන හා නඩත්තු වියදම් සියයට 43 කින් පහල යාමට හේතු වී තිබුණි.

## 2.3 අනුපාත විශ්ලේෂණය

| අනුපාතය | 2022 දෙසැම්බර් 31 දිනට | 2021 දෙසැම්බර් 31 දිනට | පෙර වසරට සාපේක්ෂව වෙනස් වීම යහපත් ද අයහපත් ද යන වග |
|---|---|---|---|
| ජංගම අනුපාතය | 1. 1 | 1.39 | අයහපත් පහල යාමකි |
| ක්ෂණික අනුපාතය | 1.09 | 1.37 | අයහපත් පහල යාමකි |
| ශුද්ධ ලාභ අනුපාතය | 4 | 45 | අයහපත් පහල යාමකි |
| ණය ස්කන්ධ අනුපාතය | 0.45 | 0.46 | යහපත් පහල යාමකි |
| මුළු ණය- මුළු වත්කම් අනුපාතය (සියයට) | 28.67 | 30.28 | අයහපත් ඉහළ යාමකි |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

i. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ජංගම අනුපාතය හා ක්ෂණික අනුපාතය පිළිගත් අවම මට්ටමේ පැවති අතර පෙර වර්ෂය සමඟ සැසඳීමේදී එකී අනුපාතයන් වල අඩුවීමක් නිරූපනය විය. ගෙවිය යුතු ණය පොලී වියදම් රු. මිලියන 25,785 කින් වැඩිවීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වි තිබුණි.

ii. සමාලෝචිත වර්ෂයේ ශුද්ධ ලාභ අනුපාතය පෙර වසර සමග සැසඳීමේ දී සියයට 41 ක අඩුවීමක් නිරූපනය වන අතර ඒ සඳහා ප්‍රාග්ධන ප්‍රදාන රු. මිලියන 64,079 කින් අඩු වීම, ණය පොලී වියදම රු.34,695 කින් ඉහල යාම හා අධිවේගී මාර්ග වියදම රු. මිලියන 2,796 කින් ඉහලයාම ප්‍රදාන වශයෙන් හේතු වි තිබුණි.

iii. පෙර වසරට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දිගුකාලීන ණය සියයට 2.3 කින් පහල යනවිට එදිනට අධිකාරියේ ස්කන්ධය සියයට 3.1 කින් පමණක් ඉහල යාම ණය ස්කන්ධ අනුපාත පෙර වසරට සාපේක්ෂව යහපත් වීම කෙරෙහි බලපා තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 හඳුනාගත් පාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 දෙසැම්බර් 31 දින වන විට අධිකාරිය විසින් කෙටි කාලීන ස්ථිර තැන්පතුවල ආයෝජනය කර තිබූ රු.මිලියන 1,226.43 ක් රේඛීය අමාත්‍යාංශයේ ඉල්ලීම මත අමාත්‍යාංශය වෙත ලබා දී තිබීම හේතුවෙන් අධිකාරියට අහිමි වූ පොළී ආදායම රු.මිලියන 410.69 ක් විය. එමෙන්ම මහා භාණ්ඩාගාරයේ එකඟතාවයකින් තොරව රේඛිය අමාත්‍යාංශ වැයවිෂයන් වෙත මුදල් ලබාදීම විගණනයේ දී මතභේදාත්මක විය. | රටේ පැවති අර්බුදකාරි වාතාවරණය මත රේඛීය අමාත්‍යාංශයට මුදල් ලැබීම සිදුනොවිය. මාර්ග සංවර්ධනයට ලබා දෙන ලද ඉඩම් සඳහා වන්දි මුදල් නොලැබීම නිසා මහජනතාව විසින් සිදු කරන ලද උද්ඝෝෂණයන් හේතුවෙන් මෙම ණය මුදල් ලබාදීමට සිදු විය. | මෙසේ අධිකාරිය හා අමාත්‍යාංශය අතර අරමුදල් හුවමාරු කිරීම සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගත යුතු බව. |
| (ආ) | මාර්ග සංවර්ධන අධිකාරිය විසින් මධ්‍යම අධිවේගී මාර්ග සංවර්ධන කටයුතු සඳහා 2019 නොවැම්බර් 18 දින ලංකා බැංකුවෙන් රු.මිලියන 4,312 ක ණය මුදලක් ලබා ගෙන තිබුණි. එම ණය මුදල ලබා ගැනීම සඳහා රු.මිලියන 1,500 ක ස්ථාවර තැන්පතුවක් ඇප සුරැකුමක් ලෙස තබා තිබුණද, ස්ථාවර තැන්පතුව ආරම්භකිරීමේදී පොළී ආදායම වෙනත් බැංකු ගිණුමකට බැර කිරීමට බැංකුවට උපදෙස් ලබා දී නොතිබුණි. ඒ අනුව, ණය මුදල ගෙවා අවසන් වන තෙක් පොළී මුදල් ලබා ගැනීමට නොහැකි වී තිබුණි. | 2021 වර්ෂයේ දී පොළී මුදල ලබා ගැනීමට බැංකුව සමග ලිපි හුවමාරු කරගත් නමුත් අසාර්ථක විය. 2023 වර්ෂයේ නොවැම්බර් මස නැවත පොළී මුදල ලබා ගැනීම සඳහා ක්‍රියා කරනු ලැබේ. | පොළී මුදල් ලබා ගැනීම සඳහා බැංකුව සමඟ එකඟතාවයකට පැමිණිය යුතු බව |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධිකාරිය විසින් 2019 සිට 2021 දක්වා වූ එක් එක් වර්ෂයන් සඳහා මූල්‍ය ප්‍රකාශ නැවත ගැලපීම (Re-State) සිදුකර තිබූ අතර මේ හේතුවෙන් ගෙවිය යුතු ආදායම් බදු රු.මිලියන 209.5 කින් අඩු වී තිබුණි. ඒ අනුව, වැඩිපුර ගෙවූ ආදායම් බදු අඩු කරගත යුතු වුව ද, එම වැඩිපුර ගෙවීම් වර්ෂය තුළදී ගෙවිය යුතු ආදායම් බදු වලට හිලව් කර ගැනීමට කටයුතුකර නොතිබුණි. | සංශෝධිත 2023 අංක 04 දරණ දේශීය ආදායම් පනතේ 151(1) වගන්තිය අනුව එම අගයෙන් 60% පමණක් හිලවු කිරීමට ඉඩ ලබා දී ඇත. ඒ අනුව ඉදිරියේ දී එම මුදල් හිලවු කිරීමට කටයුතු කරනු ලැබේ. | ගෙවිය යුතු ආදායම් බදු වටිනාකම නිවැරදිව ගණනය කර බදු බැර ලබා ගැනීමට කටයුතු කල යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ආ) | කොළඹ කටුනායක අධිවේගී මාර්ගයේ ඉලෙක්ට්‍රොනික ගාස්තු අය කිරීම සඳහා 2014 දෙසැම්බර් 18 දින මාර්ග සංවර්ධන අධිකාරිය, ලංකා බැංකුව සමඟ එළඹි ගිවිසුමේ ගිවිසුම් ගත කාලය 2020 ජුනි 08 දිනෙන් අවසන් වී වසර 02 ක් ඉක්මවා ගොස් ඇතත් නව ගිවිසුමකට එළඹීමට කටයුතු කර නොතිබුණි. වලංගු ගිවිසුමක් නොමැතිව 2020 සිට 2022 වර්ෂය දක්වා වර්ෂ 03 සඳහා ගනුදෙනු පිරිවැය (Transaction Cost) ලෙස එකතුව රු.මිලියන 19.7 ක් ලංකා බැංකුවට ගෙවා තිබුණි. | නව ගිවිසුමක් සැකසීම සඳහා අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් ඇගයීම් කමිටුවක් පත් කරන ලද අතර එම කමිටුව හා ලංකා බැංකුව අතර සාකච්ඡා පවත්වන අතර දෙපාර්ශවය අතර එකඟතාවයක් ඇති නොවූ නමුත් ගනුදෙනු ගාස්තුව රුපියල් 4 දක්වා අඩු කිරීමට එකඟ විය. | අධිවේගී මාර්ගයේ ඉලෙක්ට්‍රොනික ගාස්තු අය කිරීම සම්බන්ධයෙන් අධිකාරියට ඵලදායි නව ගිවිසුමකට එළඹීමට කටයුතු කළ යුතු බව |
| (ඇ) | අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල තීරණයකට අනුව කොළඹ කටුනායක අධිවේගී මාර්ගයේ ඉලෙක්ට්‍රොනික ගාස්තු ගෙවීම් ක්‍රමය භාවිතා කරන්නන් දිරිමත් කිරීම සඳහා ඉලෙක්ට්‍රොනික ගාස්තු ගෙවීමේ ක්‍රමයට මාරු වන මුල් මාස 06 ක කාලය තුළ නියමිත ගාස්තුවෙන් සියයට 10 ක වට්ටමක් එම මාර්ගය භාවිතාකරන්නන්ට ලබා දීමට තීරණය තිබුණි. කෙසේ වුවද, අනුමැතියකින් තොරව එම කාල සීමාවෙන් පසුවද එම වට්ටම් ක්‍රමය ක්‍රියාත්මක කිරීම නිසා 2022 ක වර්ෂයට අදාළව රු.මිලියන 33 ක් ද ඇතුළත්ව, 2020 සිට 2022 දක්වා වර්ෂ 03 සඳහා එකතුව රු.මිලියන 89 ක් වූ ආදායමක් අධිකාරියට අහිමි වී තිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය අනුව මාස 06 ක කාලයක් ETC පාරිභෝගිකයන් හට සියයට 10 ක වට්ටමක් ලබාදෙන ලදි. ඉන්පසු අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත එම සියයට 10 ක වට්ටම සියයට 20 දක්වා වැඩි කිරීමටද අනුමැතිය ලබාදී ඇත්තේ ETC පාරිභෝගික ආකර්ෂණය වැඩි කර ගැනීම සඳහාය. කෙසේ වුවද විය හැකි පාඩුව අවම කර ගැනීම සඳහා සියයට 10 ක වට්ටම දිගටම පවත්වා ගෙන යන ලදි. | ETC පාරිභෝගිකයන් හට වට්ටම් ලබා දීමේ අරමුණ ඉටුවීම පිළිබඳ සමාලෝචනය කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු බව. |
| (ඈ) | මාර්ග සංවර්ධන අධිකාරියේ වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තිය අනුව, ජනප්‍රිය සේවා ස්ථානයක වසර 05 ක් හෝ ජනප්‍රිය නොවන සේවා ස්ථානයක වසර 03 කට වඩා සේවය කර තිබීම ස්ථාන මාරුවක් ඉල්ලීමට සුදුසුදු වන බවත්, ජනප්‍රිය සේවා ස්ථානයක වසර 05 ක් හෝ ඊට වැඩි කාල යක් සම්පූර්ණ කර තිබීම හා මීට පෙර ජනප්‍රිය නොවන සේවා ස්ථානයක වසර 03 ක් හෝ ඊට වඩා වැඩි කාලයක් සේවය කර නොමැති අය ස්ථාන මාරු සඳහා ඉල්ලුම් නොකලද සේවයේ අවශ්‍යතාවය මත ස්ථාන මාරු කිරීමට යටත් බව ද සඳහන් වුවද, තංගල්ල විධායක ඉංජිනේරු කාර්යාලයේ අවුරුදු 05 ක සේවා කාලයක් ඉක්මවූ නිළධාරීන් 34 දෙනෙකු සේවය කර තිබුණි. | 2024 වර්ෂයට අදාලව ඉදිරියේ දී වාර්ෂික ස්ථාන මාරුවීම සඳහා අයදුම්පත් කැඳවීමට අවශ්‍ය කටයුතු මේ වන විටත් සිදු කෙරෙමින් පවතී. මෙහිදී ස්ථාන මාරුවීම් ඉල්ලා ඇති අයට ප්‍රමුඛතාවය ලබා දීමට කටයුතු කෙරේ. | අධිකාරියේ ස්ථාන මාරු ප්‍රතිපත්තිය විධිමත්ව හා සාධාරණ වන අයුරින් සහ ඵලදායි හා කාර්යක්ෂම සේවාවක් සලසාගත හැකි ආකාරයට සිදු කල යුතු බව |

| | | | |
|---|---|---|---|
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව අධිවේගී මාර්ග ඉදිකිරීම සඳහා ඉඩම් අත්පත්කර ගැනීම වෙනුවෙන් දරන ලද පිරිවැය රු.මිලියන 33,815.28 ක් වුවත් එයට අදාළ ඉඩම් ලේඛනයක් අධිකාරියේ ඉඩම් අංශය විසින් පවත්වා නොතිබුණි. | රේඛීය අමාත්‍යාංශය විසින් ගෙවීම් සිදුකරන ලද ඉඩම් තොරතුරු අධිකාරියේ දත්ත වාර්තාවල නිවැරදිව සඳහන් නොවේ. | අධිවේගී මාර්ග ඉදිකිරීම සඳහා අත්පත්කර ගත් ඉඩම් අධිකාරියේ ඉඩම් ලේඛණයක සටහන් කළ යුතු බව. |
| (ඊ) | අධිකාරියට අයත් සී/ස අධිවේගී මාර්ග ප්‍රවාහන (පුද්ගලික) සමාගම 2016 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. එමෙන්ම මහ නැගුම ඉදිකිරීම් හා යන්ත්‍රෝපකරණ සමාගමේ 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සම්බන්ධ විගණන මතය ව්‍යාචනය කර තිබුණු අතර 2020 වර්ෂය සඳහා අහිතකර විගණන මතයක් ඉදිරිපත්කර තිබුණි. | සී/ස අධිවේගී මාර්ග ප්‍රවාහන (පුද්ගලික) සමාගම 2016 සිට 2018 දක්වා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත.<br>මහ නැගුම ඉදිකිරීම් හා යන්ත්‍රෝපකරණ සමාගමේ 2018 සිට 2021 දක්වා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත. | පරිපාලිත සමාගම්වල මූල්‍ය ප්‍රකාශන කාලීනව විගණනයට ඉදිරිපත් කරන බවට මව් ආයතනය විසින් තහවුරු කර ගත යුතු බව . |
| (උ) | 2007 අංක 07 දරන සමාගම් පනතේ 133 වගන්තිය අනුව, සමාගමක් විසින් සෑම වර්ෂයකට වරක් කොටස්කරුවන්ගේ වාර්ෂික මහා සභා රැස්වීම පැවැත්විය යුතු වුවත්, අධිකාරියට අයත් එහි පරිපාලිත සමාගම් 04 ඒ අනුව කටයුතු කර නොතිබුණි. | පරිපාලිත සමාගම්වලින් සමහරක් ආයතන ස්ථාපනය කිරීමේදී කොටස් අයිතිය පිළිබඳව ඇති වූ නීතිමය ගැටලු නිසා එම ආයතන වාර්ෂික මහාසභා රැස්වීම් නොතිබීමට තීරණය කරන ලදී. | සමාගම් පනත අනුව වාර්ෂික මහ සභා රැස්වීම් පැවැත්වීමට කටයුතු කළ යුතු බව |
| (ඌ) | 2023 මාර්තු 20 දිනැති අංක CP/23/0394/608/033 අනුව අධිකාරිය සතු පරිපාලිත සමාගම් 04 ඈවර කිරීමට තීරණය කර තිබීම හේතුවෙන් අදාළ සමාගම්වල අඛණ්ඩ පැවැත්ම අවිනිශ්චිත තත්ත්වයක පැවතුණි. | මාර්ග සංවර්ධන අධිකාරිය විසින් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගෙන් සමන්විත විශේෂ කමිටුවක් මගින් පාලිත සමාගම් ඈවර කිරීම සම්බන්ධව කටයුතු කරනු ලැබේ. | සමාගම් විධිමත්ව ඈවර කර අධිකාරිය සතු සම්පත් ආපසු පවරා ගැනීමට කටයුතුකළ යුතු බව. |

### 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධිකාරිය සතු පිරිවැය රු.මිලියන 228.6 ක් වූ වාහන 19 ක්, මහා මාර්ග අමාත්‍යාංශ සහ අග්‍රාමාත්‍ය කාර්යාලය වෙත ද, රු.මිලියන 83.5 ක් පිරිවැය වූ වාහන 11 ක් මහ නැගුම ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ සමාගම වෙත ද ලබා දී තිබුණු අතර අධිවේගී මාර්ගයන්හි රාජකාරි අවශ්‍යතාවයන් සඳහා සමාලෝචිත වර්ෂයේ දී රු.මිලියන 281.35 ක් වැයකර බාහිර ආයතනවලින් කුලී පදනම මත වාහන ලබාගෙන තිබුණි. | අධිවේගී මාර්ග පද්ධතියේම මෙහෙයුම් හා නඩත්තු කටයුතු පැය 24 පුරාවටම යෙදෙන අතර එම මෙහෙයුම් කටයුතු සහ නඩත්තු කටයුතු අඛණ්ඩව පවත්වා ගන යාම සඳහා මෙම වාහන කුලී පදනම මත ලබා ගෙන ඇත. | අධිකාරිය සතු උපයෝජනය නොකරන වාහන ඵලදායීව භාවිතා කිරීම හා ඒ තුළින් පිරිවැය අඩුකර ගැනීමට කටයුතු කල යුතු බව |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2022 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති කාර්යාල විසින් ඉදිරිපත් කරන ලද විස්තර අනුව, ව්‍යාපෘති 14 ක් වෙනුවෙන් අත්කරගත් සමස්ථ ඉඩම් කැබලි සංඛ්‍යාව 48,427 ක් වූ අතර ඉඩම් අත්පත්කරගැනීමේ පනතේ 44 වගන්තිය යටතේ සමාලෝචිත වර්ෂය අවසන් වන විට අධිකාරියට අයිතිය පවරාගත් කැබලි සංඛ්‍යාව 4,543 ක් හෙවත් එයින් සියයට 09 ක් පමණක් වී තිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නැත. | ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු අවසන්කර අයිතිය පවරාගැනීමට හා ඒවා අධිකාරිය විසින් ගිණුම්වල වාර්තා කිරීමට කටයුතු කළ යුතු බව |
| (ඇ) | විගණනය වෙත ලබා දී ඇති තොරතුරු අනුව 2022 දෙසැම්බර් 31 දින වන විට දේශීය බැංකු මඟින් ලබාගත් ණය වලින් ආපසු ගෙවීමට ඇති ණය ප්‍රමාණය රු.මිලියන 356,059.32 ක් වූ අතර, ණය ලබාගැනීම නිසා වසර 05 ක කාලය තුළ දේශීය වාණිජ බැංකු වෙත ගෙවීමට සිදු වී තිබුණු පොලී ප්‍රමාණය රු.මිලියන 108,970.36 ක් විය. තවද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු පොලිය රු.මිලියන 37,668.7 ක් ද ගෙවිය යුතු ණය වාරික වටිනාකම රු.මිලියන 2,502.3 ක් ද විය. | 2022 අප්‍රේල් මස සිට දිවයින තුල පැවති ආර්ථික අර්බුදය හමුවේ පොලී අනුපාතිකය ඉතා විශාල පරතරයකින් ඉහළ යෑම හේතුවෙන් 2022 වර්ෂයේ ණය පොළී මුදල අසාමාන්‍ය ලෙස වැඩි වී ඇත. මෙය AWPLR වැඩි වීම නිසා උද්ගත වූ තත්ත්වයක් වන අතර රට යථා තත්ත්වයට පත් වූ විට මෙම වියදම ප්‍රමාණාත්මකව අඩු විය හැක. | ලබා ගන්නා ලද ණය මුදල් ඵලදායීව ආයෝජනය කිරීමට කටයුතුකළ යුතු බව. |
| (ඈ) | අධිකාරිය විසින් වසර 2 ½ ත් 4 ½ ත් අතර සහන කාලයක් මත පදනම්ව වසර 10 ත් වසර 18 ත් අතර කාලයක් තුළ ගෙවා අවසන් කිරීමේ පදනම මත දේශීය වාණිජ බැංකු 07 කින් අවස්ථාවන් 34 ක දී ලබාගෙන තිබුණු රු.මිලියන 408,541.01 කින් 2022 දෙසැම්බර් 31 දිනට තවදුරටත් ගෙවියයුතුව තිබුණු රු.මිලියන 356,059.31 ක් වටිනා ණය, වාරික ගෙවීමේ කාලය තවදුරටත් දීර්ඝ කරමින් 2020 මාර්තු 13 දිනැති අංක MFE/ERD/14/CM/2020/065 දරණ අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කර ණය ප්‍රතිව්‍යුහගත කර තිබුණි. ප්‍රතිව්‍යුහගතකරණයට අදාල උපදෙස් ලබා ගැනීම වෙනුවෙන් මහජන බැංකුව වෙත රු.මිලියන 10.80 ක උපදේශන ගාස්තුවක් ගෙවා තිබුණු අතර ණය ප්‍රතිව්‍යුහගත කිරීම නිසා වාර්ෂිකව වැඩි වූ පොලී අනුපාතය මත රු.මිලියන 400.74 ක අතිරේඛ පොලී මුදලක් ගෙවීමට අධිකාරියට සිදුව තිබුණි. | මහජන බැංකුව සහ ලංකා බැංකුව ඒකාබද්ධ ගනුදෙනු උපදේශනය සඳහා පත් කල ද ලංකා බැංකුව සඳහා කිසිදු ගාස්තුවක් නොගෙවූ අතර මහජන බැංකුව විසින් රු. මිලියන 20.0 ක් බිල්පතක් ඉදිරිපත් කරන ලදී. මහාභාණ්ඩාගාරයට මෙම ණය වාරික ගෙවීම සඳහා මුදල් නොමැති වීම නිසා ණය වාරික ගෙවීම වසර 10-15 දක්වා ප්‍රමාද කරන ලදී. එම කාලය තුල ගෙවිය යුතු ණය පොලිය (පදනම් පොලිය) 0.75% ක් ගෙවීමට අනුමැතිය ලබා දී තිබුණ ද එය 0.5% ක පොලී අනුපාතයකට ණය කළමනාකරණය මගින් අඩු කරන ලදී. වාර්ෂිකව වැඩි වූ පොලී අනුපාතය මත රු. මිලියන 400.74 ක අතිරේක පොලී මුදලක් ගෙවීම යන කරුණ සෘජු පිරිවැයක් සේ ඇස්තමේන්තු කර දක්වා ඇත. | නැවත ගෙවීමේ හැකියාව සැලකිල්ලට ගෙන ණය ලබා ගැනීම මගින් වැය වන අතිරේඛ පිරිවැය අවමකර ගැනීමට කටයුතුකළ යුතු බව |
| (ඉ) | 2019 සැප්තැම්බර් 25 දිනැති අංක අ.ම.ප./19/2547/119/068-1 සහ 2019 අගෝස්තු 07 දිනැති අංක අ.ම.ප./19/1983/119/068 දරණ අමාත්‍ය මණ්ඩල තීරණ අනුව මීරිගම සිට කුරුණෑගල දක්වා මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ දෙවන කොටස සංවර්ධනය කිරීම, හිඟ බිල්පත් | මධ්‍යම අධිවේගී මාර්ග - II ව්‍යාපෘතිය සඳහා දේශීය බැංකු ණය, භාණ්ඩාගාර ඇපකර මත ලබා ගැනීමට කටයුතු කර තිබුණි. මෙම බිලියන 08 ක දේශීය ණය ලබා ගැනීමේදී මහාභාණ්ඩාගාර ඇපකර නිකුත් කිරීමට තිබුණු නොහැකියාව | අධිවේගී මාර්ග ව්‍යාපෘති කඩිනමින් අවසන්කර එම ව්‍යාපෘති ආදායමින් ණය ගෙවීමට කටයුතු කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | ගෙවීම, එම මාර්ගයේ I, II සහ III කොටස්වල ඉඩම් අත්පත්කර ගැනීම වෙනුවෙන් වූ වන්දි මුදල් ගෙවීම සඳහා දේශීය බැංකු වෙතින් ණය ලබා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණි. එහිදී නැවත ගෙවීමේ හැකියාව මත අධිවේගී මාර්ගයෙන් එකතුවන මුදල් භාවිතා කරමින් ණය වාරික සහ ණය පොලිය ගෙවීමේ පදනම මත 2019 නොවැම්බර් 18 දින ලංකා බැංකුවෙන් රු.මිලියන 4,312 ක් ද 2019 ඔක්තෝබර් 04 දින මහජන බැංකුවෙන් රු.මිලියන 3,688 ක් ද ලෙස එකතුව රු.මිලියන 8,000 ක ණය මුදලක් ලබා ගෙන තිබුණි. 2022 දෙසැම්බර් 31 දින වනවිට තවදුරටත් ගෙවීමට ඇති ණය ශේෂයන් පිළිවෙලින් රු. මිලියන 2,084 ක් හා රු.මිලියන 1,720.68 ක් ද විය. ඒ අනුව, අධිවේගී මාර්ගයේ ආදායමින් ගෙවා ඇති ණය වාරික වටිනාකම රු. මිලියන 4,195 ක් වූ අතර, මෙම ණය මුදල් සඳහා ගෙවා ඇති පොලී ප්‍රමාණය දළ වශයෙන් රු.මිලියන 3,000 කට ආසන්න වී තිබුණි. තවද, ණය මුදල් භාවිතා කර සංවර්ධනය කරන ලද අධිවේගී මාර්ගයන් හි ඉදිකිරීම් කටයුතු අතර මඟ නතරකර තිබුණි. | නිසාත් සියළුම විදේශ ණය සඳහා මහාභාණ්ඩාගාරය විසින් දරණු ලැබීම නිසා මාර්ග සංවර්ධන අධිකාරියට හැකි පමණින් අධිවේගී මාර්ග වලින් එකතු කරන ආදායම භාවිතාකර දේශීය බැංකු ණයක් ලබා ගැනීමට ඉදිරිපත් වූ යෝජනාවට අනුව ක්‍රියාත්මක විය. | |
| (ඊ) | දේශීය බැංකු මඟින් ලබාගත් ණය මුදල් සඳහා ණය පොලිය සහ වාරිකය ලෙස 2022 දෙසැම්බර් 31 දිනට හිඟව තිබුණු මුදල් පියවීම සඳහා භාණ්ඩාගාරයට ප්‍රතිපාදන ලබාදීමට නොහැකිවීම මත සියයට 22.5 ක පොලී අනුපාතයක් යටතේ රු. මිලියන 36,671.62 ක භාණ්ඩාගාර බැඳුම්කර (Treasury Bonds) නිකුත් කර තිබුණි. තවද දේශීය බැංකු මඟින් ණය ලබා ගැනීමට අමතරව මාර්ග කි.මී. 100,000 යේ වැඩ සටහනට අදාළව මාර්ග ඉදිකිරීම් කටයුතු සඳහා කොන්ත්‍රාත්කරුවන් 36 දෙනෙකු වෙත ගෙවීමට තිබූ රු.මිලියන 32,217.89 ක් සඳහා ද 2022 දෙසැම්බර් 31 දින වන විට සියයට 22.5 ක පොලී අනුපාතයක් යටතේ භාණ්ඩාගාර බිල්පත් නිකුත් කර තිබුණි. මේ ආකාරයට භාණ්ඩාගාර බිල්පත්‍ර නිකුත් කිරීම නිසා රජයට අමතර වියදමක් දැරීමට සිදුවන අතර වාර්ෂික එම වියදම ආසන්න වශයෙන් රු.මිලියන15,155.69 ක් පමණ වී තිබුණි. | රට තුල පැවති අර්බුදකාරී වාතාවරණය හමුවේ නොගෙවන ලද බිල්පත් රු.බිලියන 80.0 ක් පමණ තිබූ අතර ඒ සඳහා අක්මුදල් මහාභාණ්ඩාගාරය හරහා අධිකාරිය වෙත නොලැබුණි. එයට විකල්ප විසඳුමක් ලෙස මෙම භාණ්ඩාගාර බැඳුම්කර ලබා දීමේ යෝජනාව ඉදිරිපත් විය. එය නොකළේ නම් ඉදිකිරීම් ක්ෂේත්‍රය සම්පූර්ණයෙන් කඩා වැටීමට ඉඩ තිබූ බැවින් භාණ්ඩාගාර බැඳුම්කර ලබා ගැනීම අනාගත දැක්මක් සහිතව ගන්නා ලද ඵලදායී තීරණයක් වේ. මෙහි ප්‍රතිඵලයක් ලෙස රට තුල මුදල් සංසරණය වෙමින් කුඩා පරිමාන ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන්ගේ සිය කාර්යයන් පිළිබඳව යලි පිබිදීමක් ඇති විය. | අරමුදල් නොමැතිව ඉදිකිරීම් ව්‍යාපෘති ආරම්භ නොකළ යුතු අතර, වෙළඳපල වෙනස්වීම් සැලකිල්ලට ගෙන අවම පිරිවැය තත්ත්වයන් යටතේ ණය ලබා ගැනීම සිදුකළ යුතු බව. |

## 3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 21(1) වගන්තිය අනුව, ප්‍රාදේශීය සභා පරිපාලන සීමාව තුළ පවතින මංමාවත් සහ මාර්ග වල අයිතිය එම පළාත් පාලන ආයතනය සතු වේ. මේ අනුව, අධිකාරිය විසින් එම මාර්ග අලුත්වැඩියා සහ සංවර්ධන කටයුතු සඳහා දරන වියදම් එම ආයතනවලට ප්‍රාග්ධනිත කළ යුතු වුවත් එසේ ප්‍රාග්ධනිත කිරීමකින් තොරව වියදමක් ලෙස කපා හැරීම විගණනයේ දී මතභේදාත්මක විය. සමාලෝචිත වර්ෂයේ දී එලෙස අධිකාරියට අයත් නොවූ (Non-RDA) මාර්ග වෙනුවෙන් දරන ලද රු.මිලියන 9,218 ක් වියදම් ලෙස කපා හැර තිබුණි. | කි.මී. 100,000 ව්‍යාපෘතිය යටතේ මාර්ග සංවර්ධන අධිකාරියට අයත් නොවන (Non RDA) මාර්ග වෙනුවෙන් 2022.12.31 දිනට වැය කල මුදල (සියලුම Mob Advance අය කරගත් පසු) ප්‍රාග්ධනිත නොකර සංවර්ධන වියදම් යටතේ කපා හැරීම සිදු කර ඇත.<br>ඒ වෙනුවෙන් 2022 වසරේදී Non RDA මාර්ග 225 ප්‍රමාණයට අදාල රු.මි. 9,706.84 ක වටිනාකම වියදම් ලෙස කපා හරින ලදී. | පලාත් පාලන ආයතන සීමාවට අයත් මාර්ග සඳහා දරන පිරිවැය අදාළ පලාත් පාලන ආයතනය විසින් ගිණුම්ගතකළ හැකි වන පරිදි අවශ්‍ය තොරතුරු ලබා දීමේ ක්‍රමවේදයක් සකස්කළ යුතුය |
| (ආ) | දුර්වල පාලම් ප්‍රතිසංස්කරණ වැඩසටහන යටතේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කෙරීගෙන යන වැඩ වටිනාකම රු.මිලියන 692.48 ක් විය. ඒ තුළ ඇතුළත් රු.මිලියන 50.29 ක් වූ ඌව පළාතට අයත් අංක 13/6 දරන දෙමෝදර- ස්ප්‍රින් වැලි පාලම ප්‍රතිසංස්කරණය කිරීමේ කොන්ත්‍රාතුව 2019 ජුනි 05 දින ආරම්භ කර 2020 මාර්තු 31 දින වන විට නිම කිරීමට නියමිතව තිබුණි. කෙසේ වුවද, කොන්ත්‍රාත්කරු වෙත වැඩ පූර්ව අත්තිකාරම් ගෙවීම 2020 මැයි 29 සහ 2020 සැප්තැම්බර් 07 දක්වා ප්‍රමාද වීම හේතුවෙන් කොන්ත්‍රාත්කරු විසින් අදාළ කාර්යය නිමකර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට එහි භෞතික ප්‍රගතිය සියයට 90 ක් ව පැවතුණි. | දෙමෝදර ස්ප්‍රින් වැලි පාලමේ කොන්ත්‍රාත්තුව 2022 ජුනි 13 දක්වා දීර්ඝ කල අතර භෞතික ප්‍රගතිය සියයට 90 තිබියදී ප්‍රධාන ඉංජිනේරු විසින් එහි ඉතුරු වැඩ වගකීම් කාලය තුළ කොන්ත්‍රාත්කරු විසින්ම අවසන් කල යුතු බව සඳහන් කරමින් අතුරු වැඩ නිම කල සහතිකය නිකුත් කර ඇත. ඉතිරි වැඩ මේ වන විට අවසන් කර ඇතත් සම්පූර්ණ වැඩ නිම කිරීමේ සහතිකය මෙතෙක් නිකුත් කර නොමැත. | කොන්ත්‍රාත් වැඩ කඩිනමින් ඉටු කර ගත යුතු අතර, ප්‍රමාද වන ව්‍යාපෘති සම්බන්ධයෙන් කොන්ත්රාත් ගිවිසුම අනුව ක්‍රියකළ යුතු බව. |
| (ඇ) | 2022 දෙසැම්බර් 31 දිනට කි.මී. 100,000 මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය යටතේ 2020 – 2022 කාලය තුළ අධිකාරියට අයත් නොවන මාර්ගවල ප්‍රතිසංස්කරණ කටයුතු වෙනුවෙන් දරන ලද පිරිවැය ලෙස කෙරීගෙන යන වැඩ(WIP – Non RDA) යටතේ දැක්වෙන වටිනාකම රු.මිලියන 125,586.76 ක් විය. එහෙත් මෙම කෙරිගෙන යන වැඩවලට අදාළ කොන්ත්‍රාත්කරුගේ නම්, කොන්ත්‍රාත් කාලය, වටිනාකම හා කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීම් යන තොරතුරු ඇතුළත් කොන්ත්‍රාත් ලේඛනයක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | පළාත් නවය තුල මෙම දත්ත විශාල ප්‍රමාණයක් ඇති බැවින් විගණනයෙහි සඳහන් තොරතුරු එක් වාර්ථාවක් ලෙස ගොනු කිරීම සඳහා දත්ත විශ්ලේෂණය කිරීමට ප්‍රමාණවත් කාලයක් ගත වේ. | අදාළ තොරතුරු මෘදු පිටපතක් මගින් හෝ පවත්වාගෙන යා යුතු අතර විමසූ විටදී විගණනය වෙත ඉදිරිපත්කළ යුතු බව. |
| (ඈ) | මාර්ග කිලෝමීටර් 100,000 ව්‍යාපෘතිය හැර අධිකාරිය ක්‍රියත්මක කරන ලද කොන්ත්‍රාත් වලට අදාළව 2022 දෙසැම්බර් 31 දිනට රඳවා ගෙන තිබූ මුදල රු.මිලියන 1,089.73 ක් වූ අතර, එම ශේෂය තුළ වර්ෂ 03 ඉක්ම වූ වටිනාකම රු.මිලියන 503.66 ක් විය. කොන්ත්‍රාත්කරුවන් විසින් කොන්ත්‍රාත් කටයුතු කාලීනව අවසන් නොකිරීම සහ දෝෂ නිවැරදි නොකිරීම හේතුවෙන් රැඳවුම් මුදල් කාලීනව නිදහස් | නොයෙක් හේතුමත කොන්ත්‍රාත් කටයුතු කාලීනව අවසන් නොවී තිබීම, අවසන් වුවද රඳවාගත් මුදල් ඉල්ලුම් නොකිරීම ආදී හේතු මෙසේ මුදල් නිදහස් නොකිරීමට බලපා ඇත. | කොන්ත්‍රාත් වැඩ නියමිත කාල සීමා තුළදී නිම කිරීමට අවශ්‍ය සියලු පියවර ගත යුතු අතර පසු කාලීනව රැඳවුම් මුදල් නිදහස් කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | කිරීමට නොහැකි වී තිබුණි. | | |
| (ඉ) | 2022 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රඳවා ගත් මුදලින් රු.මිලියන 175.60 ක් කොන්ත්‍රාත්කරුවන් විසින් ඉල්ලුම් නොකිරීම නිසා රඳවා ගෙන තිබූ අතර, මෙයින් දෝෂ වගකීම් කාලය ඉක්මවා ඇති සහ වැඩ අවසන්කර නොමැති දැයට කිරුළ ව්‍යාපෘතිය යටතේ රඳවා ගැනීම් මුදල් රු.මිලියන 22.88 කින් රු.මිලියන 12.42 ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසාන දිනට ලියා හැරීමට යෝජනා කර තිබුණි. තවද, දකුණු පළාත් ප්‍රාදේශීය කාර්යාලය සිදු කරන ලද කොන්ත්‍රාත් ව්‍යාපෘති 45 ක දෝෂ වගකීම් කාලය 2017 – 2021 වර්ෂයන් හිදී අවසන් වී ඇතත්, වැඩ අවසන් කිරීමේ සහතිකය නිකුත් නොකිරීම නිසා ගෙවිය යුතු රඳවා ගැනීමේ මුදල් රු.මිලියන 5.72 ක් පැවතුන අතර, කොන්ත්‍රාත් 08 කට අදාළ රු.මිලියන 8.51 ක රඳවා ගැනීමේ මුදල් ගෙවීම් සඳහා අරමුදල් නොමැති වීම මත නිරවුල් කර නොතිබුණි. | රුපියල් මිලියන 12.42 ක මුදල ලියා හැරිමට යෝජනා කිරිමට හේතු වූ කරුණු ඉදිරිපත්කර ඇත. | රැඳවුම් මුදල් කාලීනව නිදහස්කළ යුතු බව. |
| (ඊ) | සමාලෝචිත වර්ෂය අවසාන වන විට කොන්ත්‍රාත් කටයුතු ඉටු කිරීම සඳහා සේවාදායකයන්ගේ ලබාගත් මුදල් තැන්පතු ශේෂය (Client Deposit) රු.මිලියන 2,959.35 ක් විය. එයින් වර්ෂ 05 ඉක්මවා තිබූ නමුත්, ඉටු නොකරන ලද කොන්ත්‍රාත් සංඛ්‍යාව 150 ක් වූ අතර, එයට අදාළ ශේෂය රු.මිලියන 614.94 ක් විය. තවද, වර්ෂ 3-5 ක් අතර ඉටු නොකරන ලද කොන්ත්‍රාත් සංඛ්‍යාව 449 ක් වූ අතර, එයට අදාළ ශේෂය රු.මිලියන 1,015.75 ක් විය. පළාත් කාර්යාල සමඟ කොන්ත්‍රාත් සම්බන්ධ තොරතුරු හුවමාරුව ප්‍රමාදවීම සහ පසුවිපරම් කටයුතුවල පවතින දුර්වලතා ද මෙම මුදල් තැන්පතු නිරවුල් නොකිරීමට හේතු වී තිබූ බව නිරීක්ෂණය විය. තවද, මෙම සේවාදායක තැන්පතු ශේෂය තුළ ඇතුළත් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් වැඩිපුර ගෙවා තිබූ රු.මිලියන 42.96 ක් 2022 නොවැම්බර් 16 දින ඉල්ලුම් කර තිබුණු නමුත් අධිකාරිය විසින් එහි නිවැරදි බව තහවුරු කර විගණිත දිනය වන 2023 ජුනි 10 දින වන විටත් එම වටිනාකම නිරවුල් කර නොතිබුණි. | වසර 5 ඉක්මවූ ශේෂයන් පවතින්නේ මහනුවර අපජල කළමනාකරණ ව්‍යාපෘතියට හා විසල් මාතලේ ජල ව්‍යාපෘතියට අදාල තැන්පතු වේ. මෙම ව්‍යාපෘතීන් මේ වන තෙක් වැඩ අවසන් වී නොමැති බැවින් එම තැන්පතු මේ දක්වා රඳවා ගෙන ඇත. කෙසේ වෙතත් මේ වන විට අවසන් කර ඇති ව්‍යාපෘති වල යම් ඉතිරියක් ඇත්නම් ඒවා ආදායමට බැර කරන ලෙස ද නිම නොකල වැඩ හැකි ඉක්මනින් නිම කරන ලෙස සියලු පළාත්භාර අධ්‍යක්ෂවරුන් දැනුවත් කිරීම සඳහා උපදෙස් ලබා දී ඇත | කොන්ත්‍රාත් කටයුතු කඩිනමින් අවසන් කිරීමට හා ඉතිරි සේවාදායක තැන්පතු පියවීමට කටයුතුකළ යුතු බව |
| (උ) | අධිකාරිය විසින් ඉදිකිරීම් ව්‍යාපෘතීන් 10 ක් සඳහා කොන්ත්‍රාත්කරුවන්ට ලබා දී තිබූ අත්තිකාරම් මුදල්වල වටිනාකම රු.මිලියන 45,811.79 ක් වූ අතර, එම වටිනාකම් තුළ ව්‍යාපෘති 05 කට අදාළව ලබා දී තිබූ රු.මිලියන 15.53 ක අත්තිකාරම් 2015 වර්ෂයට පෙර ලබා දී තිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අදාළ ශේෂ නිරවුල්කර නොතිබුණි. තවද, මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය අදියර I, මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය අදියර III සහ රුවන්පුර අධිවේගී මාර්ග ව්‍යාපෘතිය සඳහා එකතුව රු.මිලියන 39,976.2 ක් අත්තිකාරම් ලෙස ගෙවා තිබූ අතර, අදාළ ව්‍යාපෘති 03 හි වැඩ අතරමඟ | මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය අදියර I, මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය අදියර III යන ව්‍යාපෘති කෙරෙමින් පවතින අතර ඉදිරි බිල්පත් නිරවුල් කිරීමේදී ඊට අදාල අත්තිකාරම් මුදල් පියවා ගනු ලැබේ. දැනට ඉදිකිරීම් කෙරෙමින් පවතින අත්තිකාරම් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. තවද නඩු කටයුතු පවතින ව්‍යාපෘතීන්හි අත්තිකාරම් ඊට අදාල නඩු කටයුතු අවසන් වීමෙන් පසු අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. | කඩිනමින් කොන්ත්‍රාත් වැඩ අවසන් කර ගැනීමට සහ අත්තිකාරම් මුදල් අයකර ගැනීමට කටයුතුකල යුතු බව |

| | | | |
|---|---|---|---|
| | නතරකර තිබුණි. ඒ අනුව වැඩ ආරම්භ කිරීම සඳහා ලබා දී ඇති රු.මිලියන 45,811.79 ක අත්තිකාරම් පියවා ගැනීමට නොහැකි වී තිබුණි. | | |
| (ඌ) | ශ්‍රී ලංකා රජය, කොරියානු ආනයන අපනයන බැංකුව සමඟ 2017 අප්‍රේල් 06 දින එළඹෙන ලද එකඟතාවය අනුව එ.ජ.ඩො.මිලියන 199.27 ක ණය මුදලක් මහනුවර උමං මාර්ගය ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා ලබා දීමටත් එම ණය මුදල ලබා ගන්නා දිනයේ සිට වසර 05 ක කාලයක් තුළ වැඩ අවසන් කිරීමටත් නියමිත වී තිබුණි. අදාළ ණය මුදල ලබා ගැනීම සම්බන්ධයෙන් ලිඛිත ගිවිසුමක් ඇති කර ගැනීමට පෙර පරිසර බලපෑම් ඇගයීම් වාර්තාව (EIA) ලබා ගෙන ඒ සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතිය ලබා ගැනීමට සහ නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමටත් තීරණය කර තිබුණි. ඒ අනුව, ඇස්තමේන්තු වටිනාකම රු.මිලියන 95.75 ක් වූ පරිසර බලපෑම් ඇගයීම් වාර්තාව සකස් කිරීමේ කොන්ත්‍රාත්තුව පේරාදෙණිය විශ්ව විද්‍යාලය වෙත 2021 මාර්තු 25 දින බාර දී තිබුණු අතර, ඒ සඳහා රු.මිලියන 59.86 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විට කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණු නමුත්, අදාළ වාර්තාව සැකසීමේ කටයුතු 2023 මැයි 31 දින වන විටත් අවසන්කර නොතිබුණි. තවද, නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීමේ කොන්ත්‍රාත්තුව පෞද්ගලික සමාගමක් වෙත 2022 ඔක්තෝබර් 04 දින රු.මිලියන 8.47 කට පවරා දී තිබුණු අතර, කොන්ත්‍රාත් ගිවිසුම අනුව එම කාර්යය මාස 04 ක් ඇතුළත අවසන් කළ යුතු වුවත් 2023 මැයි 30 දින වන විටත් අදාළ කාර්යය අවසන් කර නොතිබුණි. මේ හේතුවෙන් ව්‍යාපෘතිය යටතේ ඉදිකිරීම් සඳහා කොන්ත්‍රාත්කරුවකු තෝරා ගැනීමේ කටයුතු 2023 අගෝස්තු 31 දක්වා ආරම්භ කළ නොහැකිව පැවතුණි. | ව්‍යාපෘති පාරිසරික අධ්‍යයන වාර්තාව සැකසීමේ කටයුතු අවසාන අදියරේ ඇති අතර නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම සැකසීම අවසාන අදියරයේ පවතින අතර උමං මාර්ගයේ ඉදිකිරීමට යෝජිත ස්ථානවල පදිංචි නිවැසියන්ගේ අධික විරෝධතාවයන් පැවතීම හා අවශ්‍ය තොරතුරු ඔවුන් විසින් ලබානොදීම නිසා ප්‍රමාද විය. | පාරිසරික අධ්‍යයන වාර්තාව සහ නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම සැකසීමේ කටයුතු කඩිනමින් අවසන්කර සැලසුම් කළ පරිදි ව්‍යාපෘතිය ආරම්භ කළ යුතු බව. |
| (එ) | සංචාරක නිවාස ඉදිකර ගැනීම සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත අධිකාරිය විසින් 2005 වර්ෂයේ දී රු.මිලියන 60 ක් ගෙවා තිබුණි. එම මුදලින් රු.මිලියන 44.18 ක වැඩ ඉටු කරවාගෙන තිබුණද, ඉතිරි රු.මිලියන15.82 ට අදාළ වැඩ කරවා ගැනීමට හෝ අදාළ අත්තිකාරම් මුදල් ආපසු අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අධිකාරිය කටයුතුකර නොතිබුණි. | ඉතිරි මුදල් සම්බන්ධව දැනුවත් කිරීම සිදුකර එය නිරවුල් කර ගැනීමට අදාල කටයුතු සිදුකිරීමට නියමිතය. | අදාළ කාර්යය නිමකරවා ගැනීමට හෝ ඉතිරි මුදල් ආපසු අයකර ගැනීමට කටයුතු කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ඒ) | කි.මී 100,000 ක විකල්ප මාර්ග පුනරුත්ථාපනය කිරීමේ වැඩසටහන යටතේ සකස් කර තිබූ ඉංජිනේරු අධි ඇස්තමේන්තු සංශෝධනය කිරීම හා නිවැරදි කිරීම කරන ලෙස අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් වෙත රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් 2022 ඔක්තෝබර් 03 දින, උපදෙස් ලබා දී තිබුණි. තවද, අවස්ථා කිහිපයකදීම අධිතක්සේරු කරන ලද කොන්ත්‍රාත් ඇස්තමේන්තු වටිනාකම් සංශෝධනය කර අවසන් බිල්පත් ගෙවීම සිදු කරන බව අමාත්‍යාංශ ලේකම්වරයා විගණනය වෙත දැනුම් දී තිබුණි. කෙසේ වුවද පසුව, 2021 අප්‍රේල් 27 දිනට පෙර අත්සන් කරන ලද කොන්ත්‍රාත් වෙනුවෙන් ගිවිසුම්ගත වටිනාකමත් ඉන් පසු අත්සන් කරන ලද කොන්ත්‍රාත් සඳහා සත්‍ය වශයෙන් සිදුකළ වැඩ අනුව ගෙවීමටත් අමාත්‍යාංශ ලේකම්ගේ අංක MOR&H/SEC/GEN/2022/71 දරන 2022 ඔක්තෝබර් 03 දිනැති ලිපිය මගින් අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් වෙත උපදෙස් ලබා දී තිබුණි. ඒ අනුව අධිකාරිය විසින් අධි ඇස්තමේන්තු මත 2022 දෙසැම්බර් 31 දින වන විට කොන්ත්‍රාත්කරුවන් වෙත රු.මිලියන 115,435 ක් ගෙවීම විගණනයේ දී මතභේදාත්මක විය. | මේ සම්බන්ධයෙන් 2021.03.29 දින මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් අමාත්‍යාංශ නිලධාරීන් හා රජයේ විගණන නිලධාරීන් ද සහභාගීත්වයෙන් පැවැත්වූ සාකච්ඡාවේදී ඇතිවූ එකඟතාවයන් අනුව ඇස්තමේන්තු නැවත විශ්ලේෂණය (Revised) කරන ලෙස අදාල පළාත්භාර අධ්‍යක්ෂකවරුන් දැනුවත් කර ඇත. එසේ වුවද, කොන්ත්‍රාත් සමාගම් මේ සම්බන්ධයෙන් ඔවුන්ගේ විරුද්ධත්වය ලිඛිත ප්‍රකාශයක් කරමින් දන්වා සිටියේ ඉංජිනේරු ඇස්තමේන්තුව සඳහා තරඟකාරී වට්ටම් මුදලක් ලබා දී ව්‍යාපෘතිය ලබා ගෙන ඇති නිසා එම ගිවිසුම් ගත මුදලෙහි සංශෝධනයන් සඳහා එකඟ නොවන බවය. ඉංජිනේරු ඇස්තමේන්තුව මත වට්ටම් මුදලක් ලෙස කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම නිසා අධි ඇස්තමේන්තුගත වීමක් හෝ මෙමඟින් රජයට පාඩුවක් හෝ වී නොමැත. | සාකච්ඡාවේදී එකඟ වූ පරිදි අධි ඇස්තමේන්තු නිවැරදි කිරීමට හා අධි ඇස්තමේන්තු සැකසීමට දායක වූ නිලධාරීන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතුකළ යුතු බව. |
| (ඔ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට දේශිය අරමුදල් මගින් ක්‍රියාත්මක කරන ලද ජාතික, ප්‍රාදේශීය හා ග්‍රාමීය වශයෙන් කි.මී 100,000ක විකල්ප මාර්ග පුනරුත්ථාපනය කිරීමේ වැඩසටහන යටතේ කොන්ත්‍රාත්කරුවන් වෙත ප්‍රදානය කරන ලද සමස්ත මාර්ග දුර ප්‍රමාණය කි.මී.17,847 ක් වූ අතර එයින් වැඩ නිමකර තිබූ ප්‍රමාණය කි.මී. 6,298 ක් විය. තවදුරටත් කෙරීගෙන යන ප්‍රමාණය කි.මී.11,549 ක් විය. මෙම කාර්යයන් සඳහා රු. මිලියන 142,821 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ගෙවා තිබූ අතර එදිනට ගෙවීමට ඇති අතැති බිල්පත්වල වටිනාකම රු. මිලියන 16,810 ක් විය. මෙම වියදම් පියවීම සඳහා දේශීය බැංකු වෙතින් රු.මිලියන 43,205 ක් ද අමාත්‍යාංශ වැය ශීර්ෂ යටතේ රු. මිලියන 68,263 ක් ද, භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම මඟින් 2022 දෙසැම්බර් 27 දින රු. මිලියන 31,353 ක් සහ 2023 මාර්තු 13 දින රු. මිලියන 4,587 ක්ද වශයෙන් අවස්ථා දෙකකදී රු.මිලියන 35,940 ක්ද ලබාගෙන තිබුණි. | 2022 දෙසැම්බර් 31 දින වන විට මෙම කාර්යයන් සඳහා රු.මිලියන 142,821 ක් 2022.12.31 වන විට ගෙවා ඇති අතර ගෙවීමට ඇති අතැති බිල්පත්හි (Bills in hand) වටිනාකම රු. මිලියන 16,810 විය. මෙම වියදම් පියවීම සඳහා දේශීය බැංකු වෙතින් රු.මිලියන 43,205 ක් ද අමාත්‍යාංශ වැය ශීර්ෂ යටතේ රු. මිලියන 68,263 ක් ද , භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම මඟින් අවස්ථා දෙකකදී රු.මිලියන 31,353 ක් සහ රු.මිලියන 4,587 ක් ලබාදී තිබුණි. | රාජ්‍ය අරමුදල් ඵලදායී සහ මනාව සැලසුම් කරන ලද ව්‍යාපෘතිවල යෙදවීම මගින් කාර්යක්ෂම ලෙස උපයෝජනය කළ යුතු බව. |
| (ඕ) | කුරුණෑගල, පොළොන්නරුව සහ නුවරඑළිය දිස්ත්‍රික්කවල කි.මී. ලක්ෂයේ මාර්ග ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කර තිබුණු මාර්ග ඉදිකිරීමේ ව්‍යාපෘති 42 ක මාර්ග 119 කට අදාළව ඇස්තමේන්තු | විගණන ඡේදය හා එකඟ නොවේ. මෙම මාර්ග කොන්ත්‍රාත් පැකේජ සකස්කර ඇත්තේ මාර්ග කිහිපයක් ඇතුලත් වන පරිදිය. එම නිසා ද්‍රව්‍ය | ඇස්තමේන්තු අධිගණනය වීම් නිවැරදි කිරීමට හා සත්‍ය වැඩ |

| | | | |
|---|---|---|---|
| | සකස් කිරීමේ දී ප්‍රධාන වැඩ විෂයන්හි මිල අනුපාත අධිගණනය වීම, අමුද්‍රව්‍ය ප්‍රවාහන දුර සත්‍ය දුරට වඩා වැඩි වීම, ව්‍යාපෘති අධීක්ෂණ පිරිවැය සහ පරිපාලන පිරිවැය ඉහළ අනුපාතයකින් දැක්වීම, අමුද්‍රව්‍ය අපතය සඳහා අසාමාන්‍ය වටිනාකම් ඇතුළත් කිරීම හේතුවෙන් කොන්ත්‍රාත් පිරිවැය රු.මිලියන 220.91 කින් අධිගණනය වී තිබුණි. | ප්‍රවාහන දුර සැලකිල්ලට ගෙන ඇත්තේ එක් මාර්ගයක් සඳහා නොව එම කොන්ත්‍රාත්තුව යටතේ ඇති සියලුම මාර්ග සැලකිල්ලට ගෙනය. අමුද්‍රව්‍ය අවුරා තිබීම හෝ ගබඩා කිරීම සඳහා සුදුසු ආරක්ෂිත ස්ථාන සොයාගැනීමේදි වැඩ බිම් වලට තරමක් දුරින් සොයා ගැනීමට සිදු වීම නිසා නැවත ප්‍රවාහනයේදී තරමක අපතේ යාමක් සිදුවේ. අනෙකුත් ග්‍රාමීය මාර්ග ව්‍යාපෘතීන් තුල අනුගමනය කරනු ලබන ද්‍රව්‍ය හානි වීම සම්බන්ධව ඇති ක්‍රියාමාර්ගද සැලකිල්ලට ගෙන අඩුම අගයක් සහිතව ද්‍රව්‍ය හානි වීම වෙනුවෙන් සියයට 10 ක ප්‍රමාණයක් ඇස්මේන්තු සකස් කරන අවස්ථාවේ යොදාගෙන ඇත. | වටිනාකම ගෙවීමට කටයුතුකළ යුතු බව |
| (ක) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 21 (1) වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභා පරිපාලන සීමාවන් ඇතුළත මංමාවත් සහ මාර්ග සම්බන්ධ පොදු අධිකාරිය ප්‍රාදේශීය සභාව සතු බව දක්වා තිබුණද, එම විධිවිධාන නොසලකා මාර්ග සංවර්ධන අධිකාරිය විසින් මෙම මාර්ග කි.මී. ලක්ෂයේ ඉදිකිරීමේ වැඩසටහන යටතේ මාර්ග සංවර්ධනය කිරීමට ගිවිසුම්ගතව තිබු අතර, ඒ සඳහා අදාළ ප්‍රාදේශීය සභාවලින් ලිඛිත අවසරය ලබාගැනීමක් සිදුකර නොතිබුණු බව කුරුණෑගල දිස්ත්‍රික්කයේ මෙම මාර්ග ඉදිකිරීම පිළිබඳ සිදුකරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී හෙළිදරව් විය. සම්පූර්ණ කරන ලද, අතරමඟ නවතා දමන ලද හා ගිවිසුම්ගත එහෙත් වැඩ ආරම්භ නොකරන ලද මාර්ග ආපසු ලබාදීමට අධිකාරිය විසින් ප්‍රාදේශීය සභා වෙත ලිපි යොමුකර තිබුණද, එම මාර්ග සංවර්ධන කටයුතුවල පැවති අඩුපාඩු හේතුවෙන් අදාළ ප්‍රාද්ශීය සභා විසින් එම මාර්ග ආපසු භාරගැනීම ප්‍රතික්ෂේප කර තිබුණි. | විගණන ඡේදය සඳහා සංශෝධන සහිතව එකඟ වේ. | සියලු පලාත් පාලන මාර්ග නැවත අදාළ ප්‍රාදේශීය සභාවෙත විධිමත් ලෙස භාර දිය යුතුය |
| (ග) | 2022 දෙසැම්බර් 31 දින වන විට කි.මී. ලක්ෂයේ මාර්ග සංවර්ධන ව්‍යාපෘතියේ මාර්ග කි.මී. 6,426 ක් ඉදිකිරීම් කටයුතු සඳහා රු.මිලියන 193,518 ක් වූ වැඩ ඇණවුම් (Work Oder) 2481 ක් මහ නැගුම ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ සමාගම වෙත ලබා දී තිබුණු අතර, එයින් පිරිවැය රු.මිලියන 131,650 ක් වූ මාර්ග කි.මී. 4,732.8 ක වැඩ ආරම්භකර තිබුණි. ඒ අතරින් මාර්ග කි.මී.306.97 කට අදාළ වටිනාකම රු.මිලියන 5,920 ක වැඩ ඇණවුම් 71 ක කොන්ත්‍රාත් කටයුතු පමණක් ඍජුව සිදු කිරීමට සමාගම භාරගෙන තිබුණි. එය මුළු වැඩ ඇණවුම් වටිනාකමින් සියයට 03 ක් තරම් පහල අගයක් වූ අතර ඉතිරි වැඩ සියයට 97 ට අදාළ මාර්ග කි.මී. 4,425.87 ක් සඳහා පිරිවැය | මාර්ග කිලෝමීටර් 100,000 සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ අමාත්‍ය මණ්ඩල තීරණක් අනුව මහනැගුම ආයතනයට කොන්ත්‍රාත්, වැඩ ඇණවුම් (Work Orders) ලෙස ලබා දී ඇත. ඒ අනුව මහනැගුම ආයතනයට මාර්ග කිලෝමීටර් 7,377.37 ක් සඳහා වටිනාකම රුපියල් මිලියන 190,800 ක් වූ වැඩ ඇණවුම් 2416 පළාත් පළාත්භාර අධ්‍යක්ෂකවරුන් විසින් ලබා දී තිබේ. තවද, මහනැගුම ආයතනය මගින් මෙම ව්‍යාපෘති උප කොන්ත්‍රාත් ලබා | පවරන ලද වැඩ ඇනවුම් කාලීනව අවසන්කර ගැනීමටත් නියමිත අනුමැතියකින් තොරව උපකොන්ත්‍රාත් ලබා දුන් නිලධාරීන්ට විරුද්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | රු.මිලියන 125,730 ක් වූ වැඩ ඇණවුම් 1,753 ක කොන්ත්‍රාත් කටයුතු, සමාගමේ සේවා සපයන්නන් ලෙස හඳුනාගන්නා උප කොන්ත්‍රාත්කරුවන් වෙත ලබා දී තිබුණි. තවද, මෙලෙස උප කොන්ත්‍රාත් ලබා දීම මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක: 2008/1109 ට පටහැනි වූ අතර, 2020 මැයි 07 දිනැති හා අංක අමප/20/0731/221/005-1 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, රාජ්‍ය සාමාගමක් වෙත කොන්ත්‍රාත් ලබා දීමේ අරමුණු ද ඉටු වී නොතිබුණු අතර, උප කොන්ත්‍රාත්කරුවන්ගේ ලාභ ලෙස රජයේ මුදල් රු.මිලියන 20,955 ක් පමණ පෞද්ගලික කොන්ත්‍රාත්කරුවන් වෙත ප්‍රේෂණය වී තිබුණි. තවද, සමාලෝචිත වර්ෂය අවසාන වන විට මුළු වැඩ ඇණවුම් වලින් රු.මිලියන 32,736 ක් වූ වැඩ ඇණවුම් 351 ක් අවලංගු කර තිබුණු අතර, රු.මිලියන 29,130 කට අදාළ වැඩ ඇණවුම් 306 ක ඉදිකිරීම් වැඩ ආරම්භ කර නොතිබුණි. | දීම සම්බන්ධව මාර්ග සංවර්ධන අධිකාරියට දැනුම් දීමක් කර නොමැත. | |
| (ච) | මාතර දිස්ත්‍රික්කයේ කොන්ත්‍රාත්කරුවන්ට වැඩ අත්තිකාරම් ලබාදීමේ දී කොන්ත්‍රාත්කරුවන්ගෙන් ලබාගෙන තිබුණු රු.මිලියන 590.28 ක් වූ වැඩ අත්තිකාරම් සුරක්ෂණ 26 ක වලංගු කාලය සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉකුත්ව තිබුණි. නමුත් වැඩ අවසන් නොකල හා වැඩ අතර මග නතර කර ඇති මාර්ග වලට අදාල වැඩ අත්තිකාරම් සුරක්ෂණ වල වලංගු කාලසීමාව දීර්ඝ කර ගැනීමට හෝ මාර්ග සංවර්ධන අධිකාරිය වෙත පවරා ගැනීමට මාර්ග සංවර්ධන අධිකාරියේ වගකිවයුතු නිලධාරීන් කටයුතු කර නොතිබුණි. මේ හේතුවෙන් විගණිත දිනය වූ 2023 මාර්තු 15 දින වන විට කොන්ත්‍රාත්කරුවන්ට ගෙවා තිබූ වැඩ පූර්ව අත්තිකාරම් රු.මිලියන 398.92 ක් ආපසු අයකර ගැනීමට නොහැකිව පැවතුණි. | මෙම ව්‍යාපෘතියෙහි වැඩ අතරමග නතර කරන අවස්ථාවේ දී ප්‍රමාණවත් බිල්පත් ඉදිරිපත් නොවූ බැවින් සම්පූර්ණ අත්තිකාරම් මුදල අයකර ගැනීමට නොහැකි විය. අයකර ගැනීමට ඉතිරිව පවතින මුදල රු. මිලියන 389.26 කි. | වැඩ අත්තිකාරම් සුරක්ෂණ කාලය දීර්ඝ කර ගැනීමට කටයුතු කළ යුතු බව |
| (ඡ) | නියැදි විගණන පරීක්ෂාවලදී අනාවරණය වූ පරිදි කෑගල්ල දිස්ත්‍රික්කය තුළ මහනැගුම ඉදිකිරීම් සමාගම වෙත පවරන ලද පිරිවැය රු.මිලියන 1,735.62 ක් වූ ඉදිකිරීම් කොන්ත්‍රාත් 74 ක් වැඩ ආරම්භ කර නොතිබූ අතර පුත්තලම දිස්ත්‍රික්කය තුළ මාර්ග 124 ක වැඩ ආරම්භ කර නොතිබුණි. තවද පුත්තලම දිස්ත්‍රික්කය තුළ මාර්ග 20 ක් සංවර්ධනයට රු.මිලියන 5,291 ක්ද පොළොන්නරුව දිස්ත්‍රික්කය තුළ මාර්ග 10 ක් සංවර්ධනයට රු.මිලියන 377.26 ක්ද වැය කර තිබූ නමුත් එම ඉදිකිරීම්ද පුත්තලම දිස්ත්‍රික්කය තුල මාර්ග 208 ක සංවර්ධන කටයුතුද අතරමඟ නතර කර තිබුණි. මේ හේතුවෙන් මාර්ග භාවිතා කරන මහජනතාව අපහසුතාවයට පත්ව තිබූ අතර සංවර්ධන කටයුතු සඳහා ගෙන එන ලද අමුද්‍රව්‍ය අනාරක්ෂිතව පැවතුණි. | දිවයින පුරා ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වූ කොවිඩ් වසංගත තත්ත්වය, අමුද්‍රව්‍ය සපයාගැනීමේ දුෂ්කරතා, ඉන්ධන හිගය ද්‍රව්‍ය සහ සේවාවන් වල මිල අධික ලෙස ඉහල යෑම, කොන්ත්‍රාත් සමාගමට බිල්පත් ගෙවීම ප්‍රමාද වීම යන කරුණු නිසා මෙහි සඳහන් මාර්ග නිම කිරීමට නොහැකි වී ඇත. තවද, මුදල් අමාත්‍යාංශයේ අංක 03/2022 හා 2022-04-26 දිනැති චක්‍රලේඛණයට අනුව රාජ්‍ය වියදම් පාලනය කිරීමට ලබා දී ඇති උපදෙස් අනුව මෙම මාර්ග වල සංවර්ධන කටයුතු නතර කරන ලදි. | කොන්ත්‍රාත්කරුගේ ධාරිතාවය සලකා බැලීමෙන් අනතුරුව කොන්ත්‍රාත් ප්‍රදානය කළ යුතු අතර වැඩ අවසන් නොකල සහ ආරම්භ නොකල කොන්ත්‍රාත් සම්බන්ධයෙන් කොන්ත්‍රාත් ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ට) | මාතර දිස්ත්‍රික්කයේ කොන්ත්‍රාත් පැකේජ 02 ක් යටතේ ABC අතුරා සංවර්ධනය කර තිබුණු වටිනාකම රු.මිලියන 62.74 ක් වූ මාර්ග සංවර්ධන ව්‍යාපෘති 10 ක ඇතිරූ ABC සම්පූර්ණයෙන්ම ගැලවී ඉවත්වීම නිසා මාර්ග, සංවර්ධනය කිරීමට පෙර පැවති තත්වයටම පත් වී ඇති බවත්, මාර්ගය ගමනාගමනයට භාවිතා කල නොහැකි තත්වයට පත්ව ඇති බවත් නිරීක්ෂණය විය. ඒ අනුව කොන්ත්‍රාත්කරුවන්ට ගෙවා තිබූ එකතුව රු.මිලියන 17.15 ක් නිෂ්කාර්යය වියදම් වී තිබුණි. | ABC යොදා තිබූ මාර්ග මතුපිට මගින් වාහන ධාවනය වීම හා වර්ෂා සහිත කාලගුණයට නිරාවරණය වීම හේතුවෙන් ABC මතුපිට හානි සිදු වී ගමනාගමනය අපහසු තත්ත්වයට පත්වී ඇත. මෙම මාර්ග සඳහා ගෙවීම්කර ඇත්තේ ප්‍රමිතියෙන් යුක්තව සිදුකරන ලද මූලික ඉදිකිරීම් කටයුතු සඳහාය. | ඉදිකිරීම් අධීක්ෂණ කටයුතු කාලීනව සිදුකළ යුතු අතර, කොන්ත්‍රාත් ගිවිසුම අනුව අදාළ වැඩ නිමකර ගැනීමට කටයුතු කළ යුතු බව |

## 3.6 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 දෙසැම්බර් 31 දිනට අධිවේගී මාර්ග මෙහෙයුම්, නඩත්තු හා කළමනාකරණ අංශයන්හි කාර්ය මණ්ඩලය සඳහා පරිපාලන අංශය විසින් වෙන්කරන ලද කළමනාකරණ සහකාර තනතුරු සංඛ්‍යාව 81 ක් වුවද, එදිනට එම අංශ වල සේවයේ නියුක්ත තථ්‍ය සේවක සංඛ්‍යාව 136 ක් විය. ඒ අනුව අනුමත කරන ලද තනතුරු සංඛ්‍යාව ඉක්මවා සේවකයින් 55 ක් අදාළ අංශවල සේවය කරන බව නිරීක්ෂණය විය. තවද, අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අධිවේගී මාර්ග මෙහෙයුම්, නඩත්තු හා කළමනාකරණ අංශයේ මුදල් අයකැමිවරුන් සහ මුර සංචාරකවරුන් ලෙස පත්වීම් ලද එහෙත් කළමනාකරණ සහකාර තනතුරුවල තාවකාලිකව සේවය කරන සේවකයින් 24 දෙනෙකු අදාළ නිත්‍ය තනතුරු වෙත අනුයුක්තකර ද නොතිබුණි. | අධිවේගී මාර්ග මෙහෙයුම් නඩත්තු හා කළමනාකරණ අංශයට අයත් බණ්ඩාරගම ප්‍රධාන කාර්යාලයේ මෙන්ම අන්තර් හුවමාරු කාර්යාලවල සේවා අවශ්‍යතාවය මත සේවයේ යොදවා ඇති අයගෙන් පරිපාලන අංශය විසින් වෙන් කරන ලද සංඛ්‍යාව ඉක්මවා සේවයේ යෙදෙන කළමනාකරණ සහකාර වරුන් සිටින බව හා එකඟ වේ. කළමනාකරණ සහකාර නොවන තනතුරු දරණ නිලධාරීන් විසින් කළමනාකරණ සහකාර තනතුරු වල රාජකාරි ඉටු කරනු ලබන බව හා එකඟ වේ. | කාර්යය මණ්ඩලය අනුමත සීමාවට යටත් විය යුතු අතර අතිරික්ත සේවකයින් බඳවා ගැනීමට පෙර ඒ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතු බව. |
| (ආ) | අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කර කරන ලද අභ්‍යන්තර චක්‍රලේඛයක් මඟින් සෘජු කම්කරු පදනම මත බඳවාගත් සේවකයින් කාර්යාල කටයුතු වල යෙදවීම සිදු නොකරන ලෙස දන්වා තිබුණ ද, ඊට පටහැනිව පළාත් කාර්යාල සඳහා ස්ථිර සහ අනියම් පදනම මත බඳවා ගත් සෘජු කම්කරුවන් පිළිවලින් 106 දෙනෙකු සහ 181 දෙනෙකු මාර්ග නඩත්තු කටයුතු සඳහා යොදා නොගෙන කාර්යාල කටයුතු වලට යොදා ගෙන තිබුණි. | සෘජු කම්කරු පදනම මත බඳවාගෙන ඇති සේවකයින් කාර්යාල කටයුතුවල යෙදවීම සිදු නොකරන ලෙස උපදෙස් දී තිබුණද ස්ථිර හා අනියම් කම්කරුවන් අවම පිරිසක් කාර්යාල කටයුතු සඳහා යොදවාගෙන තිබූ බව හා එකඟ වේ. | අභ්‍යන්තර චක්‍රලේඛනය අනුව කටයුතු කළ යුතුය |

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 සංයුක්ත සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දිනට මාර්ග සංවර්ධන අධිකාරියේ කාර්ය මණ්ඩලය 10,801 ක් වූ අතර, එම කාර්ය මණ්ඩලය සඳහා 2022 වර්ෂයේ දී වැටුප් හා වේතන සඳහා රු.මිලියන 8,315.03 ක් ද පරිපාලන වියදම් රු.මිලියන 842.4 ක් ද, දේශීය බැංකු ණය පොලිය හා ණය වාරික සඳහා රු.මිලියන 52,621.53 ක් ද වශයෙන් සමස්ත පුනරාවර්තන වියදම් ලෙස රු.මිලියන 61,778.97 ක් සමාලෝචිත වර්ෂය තුළ දී වැය කර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වාර්ෂික සාමාන්‍ය වැටුප් හා වේතන වියදම රු.මිලියන 0.77 ක් වී තිබුණි. තවද, 2022 මූලධන වියදම් දැරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය වෙත රු.මිලියන 140,294.27 ක ප්‍රතිපාදනයක් වෙන් කර දී තිබුණ ද, ලද ප්‍රතිපාදන ප්‍රමාණය රු.මිලියන 96,008.46 ක් විය. එම ප්‍රමාණයෙන් ද රු.මිලියන 21,231.7 ක් 2021 වර්ෂයේ දී ඇති කර ගත් බැදීම් පියවීම සඳහා යොදා ගෙන තිබුණු අතර, 2022 වර්ෂයේ දී වැය කර ඇති ප්‍රාග්ධන වියදම් රු.මිලියන 98,225.92 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසන්වන විට නොපිය වූ වියදම් වටිනාකම රු.මිලියන 23,449.15 ක් විය. සමස්ත වියදම වූ රු.මිලියන 160,004.89 න් සියයට 39 ක් පමණ පුනරාවර්තන වියදම් සඳහා වැය කිරීමට සිදුවීම හේතුවෙන් මාර්ග සංවර්ධන අධිකාරියේ අරමුණු හා කාර්යභාරය ඉටු වීම පහළ මට්ටමක පැවති අතර, මේ පිළිබඳව දීර්ඝ අධ්‍යනයක් සිදුකර ඒවා ඉටු කිරීමට අදාළව ඵලදායි සංයුක්ත සැලැස්මක් හා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු විය යුතුව තිබුණි. | ඉදිරි සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේ දී විගණකාධිපති වාර්තාවේ දක්වා ඇති කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් ඒ අනුව කටයුතු කරනු ලැබේ. | වර්තමාන ආර්ථික හා පාරසරික සාධක සැලකිල්ලට ගෙන අනාගත සංයුක්ත සැලසුම පිළියෙල කළ යුතු වේ. |

### 4.2 තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරිය විසින් 2022 වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබූ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුළ තිරසර සංවර්ධන ඉලක්කයන් සපුරා ගත හැකි වන වැඩ පිළිවෙලක් නිරූපනය නොවූ අතර අධිකාරිය විසින් හඳුනාගත් තිරසර සංවර්ධන ඉලක්ක යටතේ ඉටු කිරීමට සැලසුම් කර ඇති ව්‍යාපෘතීන් මොනවාද යන්නත්, ඊට අදාළ තිරසර සංවර්ධන දර්ශකයන් (SDG Indicators) සහ වර්ෂය තුළ දී එම දර්ශකයන්ගේ අපේක්ෂිත කාර්යසාධනය වැනි නිර්ණායක වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුළ අන්තර්ගත නොවුණි. එමෙන්ම 2030 වර්ෂය දක්වා ඉටුකර ගැනීමට අපේක්ෂිත තිරසාර අරමුණු නිශ්චිතව හඳුනාගෙන නොතිබුණි. | මාර්ග සංවර්ධන අධිකාරියට අදාලව හඳුනා ගෙන ඇති තිරසර සංවර්ධන ඉලක්ක යටතේ 2030 වර්ෂය දක්වා අපේක්ෂිත අරමුණු හඳුනා ගෙන ඒ අනුව සැලසුම්ගත ව්‍යාපෘති හා අදාල තිරසර සංවර්ධන දර්ශකයන් හා ඒවායේ අපේක්ෂිත වාර්ෂික කාර්යසාධනය ඇතුලත් වන පරිදි ඉදිරි ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමට කටයුතු කරනු ලැබේ. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුළ තිරසර සංවර්ධන ඉලක්ක නිරූපනය කළ යුතු අතර, 2030 වර්ෂය දක්වා ඉටුකර ගැනීමට අපේක්ෂිත තිරසාර අරමුණු හඳුනාගත යුතු බව |